

# THE WHITE HACKLE

## පාබල රෙජිමේන්තුවෙන් බිහිකළ සවැනි යුද්ධ හමුදාධිපති

විශේෂ කලාපය

ලුතිනන් ජෙනරාල් ආර්.එම්.ඩී. රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී


ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

**www.lightinfantry.lk**


# THE WHITE HACKLE

## SPECIAL EDITION FOR THE COMMANDER OF THE ARMY

# CONTENTS

**PAGE**


- Best wishes for the new Commander of the Army, by Col of the Regt and all members of the SLLI Regiment 02
- විසිවන යුද්ධ හමුදාධිපතිතුමා ගේ පණිවිඩය 03.05------
- දිගු ගමනක ආරම්භය 06
- මලියදේව් මාතාවගෙන් යුද හමුදාවට පැමිණි දයා රත්නායක 07
- විසිවන යුද්ධ හමුදාධිපති නව තනතුරේ වැඩ භාරගැනීම 08.09
- ප්‍රභූවරුන්ගේ ආශීර්වාද ලබමින් 10 -11
- නව යුද්ධ හමුදාධිපතිතුමා විසින් කටපිරිස් ඇමතීම 12.14
- දළදා සමිඳුන්ගේ හා ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේගෙන් ආශීර්වාදය ලබමින් 15
- නව යුද්ධ හමුදාධිපතිතුමාගේ ප්‍රථම සංචාරය 16
- Message from Maj Gen (Retd) HV Athukorale VSV psc FBIM 17
- රෙජිමේන්තු අභිනන්දන 18.20
- Great Commanders Produced by the Sri Lanka Light Infantry Regiment 21.23-
- Message from Lt Col (Retd) TM Rajudin SLLI 24
- යුද්ධ හමුදාධිපතිගේ 6 ශ්‍රීලපාහ ඒකක සහ රණබිමේ මතක සටහන් 25.32
- Message from Gen (Retd) SHS Kottegoda WWV RWP RSP VSV USP ndc 33
- රෙජිමේන්තු සේනාවිධායක හා රෙජි අධිපති ලෙසින් 34.37
- ක්‍රීඩකයකු ලෙස ක්‍රීඩාවට දැක් වූ ලැදියාව 38.39
- 23 සේනාංකාධිපති ලෙස රාජකාරි කළ කාලසීමාවේ ඇස ගිය තැන් 40.41
- ශ්‍රීලපාහ සේවාවනිතා ශාඛාවේ අතීත සෙන්පතිනිය 42.43
- ඇන්ඩිට පෙම් බැඳි පාසැල් මිතුරෝ 44
- වීර වික්‍රම විභූෂණයෙන් පිදුම් ලැබූ දා 45
- ශ්‍රීලපාහ ඒකක සංචාරයන්------- 46.48


### කවරයේ කථාව

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ඉහළම තනතුර වන්නේ යුද්ධ හමුදාධිපති තනතුරයි. එදා සිට අද දක්වා යුද්ධ හමුදාධිපති ලෙසින් තනතුරු හොබවා ඇත්තේ විසි දෙනෙකු පමණි. එම විසිදෙනා අතුරින් පාබල හමුදාව හය දෙනෙකු බිහිකර ඇත. විසිවන යුද්ධ හමුදාධිපති ලෙසින් 2013.08.01 දින යුද හමුදා මූලස්ථානයේදී සුබ මොහොතින් තනතුරේ රාජකාරි ආරම්භ කළ ලුතිනන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී හා පවුලේ සාමාජිකයින් කැමරා කාචයේ සනිටුහන් වූ අයුරු.

## SPECIAL EDITION


**Colonel of The Regiment**
Maj Gen KADA Karunasekara RSP USP psc

**Centre Commandant**
Col CD Weerasuriya RSP-

**SO I (A) RHQ SLLI**
Lt Col AS Wickramasena RWP RSP psc SLLI

**Adjutant RHQ SLLI**
Maj AB Dodamwela SLLI

### The White Hackle Editors

**Editor in Chief**
Lt Col DLU De Thabrew RWP RSP psc SLLI
CO - 1 SLLI

**Assistant Editors**
Maj MWDA Nanayakkara RSP SLLI
SO II (Log) RHQ SLLI
Maj KKIA Kumara SLLI
Officer In Charge 'The White Hackle'

**Computer Designing &Type setting**
C/SGT Gunasiri SHIUK- 12 SLLI
PTE Suranga RBP - 25 SLLI

**Publisher**
Regimental Centre Sri Lanka Light Infantry

Telephone - 0112855204
0112855356 - 60
Ext - 57656
Fax - 0112855204
E-mail - editor.whitehackle@gmail.com
editor.whitehackle@yahoo.com
Website - www.lightinfantry.lk

**Printed by**
Lettra Graphic Printers,
44/1, Negombo Road, Welisara.
Tel : 011 2234191, 0777526922
email - lettrafj@gmail.com

# Best wishes for the new Commander of the Army, Lt Gen RMD Ratnayake WWV RWP RSP USP ndu psc by Colonel of the Regiment and all members of the Sri Lanka Light Infantry Regiment



Sri Lanka Light Infantry, being the pioneer regiment of the Sri Lanka Army has already completed 132 years of dedicated service to the nation. The Regiment too, has produced many charismatic and brilliant set of military leaders through the annals of our regimental history which is very unique and full of traditions and customs.

Today we are proud to mention that regiment is bestowed with honour yet again by the HE the president Mr Mahinda Rajapakse by appointing a Sri Lanka Light **Infantry Senior Officer as the 20th** Commander of the Sri Lanka Army and the sixth Commander produced from the Sri Lanka Light Infantry Regement.

Lt Gen Ratnayake is a true leader and a loyal **military officer who has served the nation with a lot of** dedication, commitment and courage. Experience he gained through his illustrious career of over 33 years especially in the war against separatist LTTE in the **battle field; cannot be simply matched with that of any other officer today in the Sri Lanka Army. His broader** knowledge on military, international and diplomatic affairs and as well the love and affection towards the motherland is well recognized and commended by many.

Lt Gen Ratnayake is a graduate of National Defence University China, Defence Services Command and Staff College in Bangladesh, United States Army Intelligence School too, and he has obtained number of **diplomas and other academic qualifications overseas** and locally and at present he is reading for PhD.

Lt Gen Ratnayake is an excellent sportsman since his school time. He represented Maliyadeva College Kurunegala in many sports. Especially, he excelled in Athletics and Rugby and won college colors for both Athletics and Rugby. In 1985, for his excellent contribution as a member of Army Rugby team he was awarded with Army colors for rugby. He not only proved that he is an excellent sportsman, but also an excellent sports administrator, since 2003 to date, he is the serving chairman of the Defence Services Athletic Committee, Chairman Army Athletic Committee since 2010, Deputy Chairman Army Athletic Committee in 2005, Council Member of Sri Lanka Football Federation and also served as the president of Sri Lanka Athletic Association in 2012.

The service he rendered to uplift the physical standard of the Regiment and the mental state of the members of the Sri Lanka Light Infantry Regiment, is noteworthy.

Finally let me summaries his achievements with a quote from Leonardo Da Vinci.

"It had long since come to my attention that people of accomplishment rarely sat back and let things happen to them. They went out and happened to things".

Let me congratulate for the new appointment of Lt Gen RMD Ratnayake WWV RWP RSP ndu psc on behalf of all members of the Sri Lanka Light Infantry Regiment.

May the Noble Triple Gem showers upon him and his family in all his future endeavours!

**KADA Karunasekara RSP USP psc**
**Major General**
**Colonel of The Regiment**
**Sri Lanka Light Infantry**

# ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, තැ: පෙ: 553, කොළඹ

# இலங்கை தரைப்படைத் தலைமையகம், த. பெ. 553 கொழும்பு

# SRI LANKA ARMY HEADQUARTERS, P: O: BOX 553 COLOMBO

### යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් යුද්ධ හමුදාධිපති තනතුරේ වැඩ භාරගැනීම නිමිත්තෙන් නිකුත් කරනු ලබන පණිවිඩය.

මුළු මහත් ලොවටම ආදර්ශයක් දෙමින් ත්‍රස්තවාදය අතුගා දමූ අභිමානවත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 20 වන යුද්ධ හමුදාධිපතිවරයා ලෙස මෙවන් පණිවිඩයක් නිකුත් කරනු ලබන්නේ නිහතමානී ආඩම්බරයකින් සහ තෘප්තියකිණි.

මාගේ වෘත්තීය යුද්ධ හමුදා ගමන් මගෙහි අභියෝගාත්මක වසර තිස්තුනකට අධික කාලපරාසය තුළදී යුද්ධ හමුදා සාමාජිකයෙකුට ලබාගැනීමට හැකි උපරිම ගෞරවය වන යුද්ධ හමුදාධිපති ධූරයෙන් පිදුම් ලබන්නා වූ මේ මොහොතේ මාගේ හද පතුලෙන්ම නැඟී එන අති විශේෂ කෘතවේදීත්වය මා ප්‍රථමයෙන්ම දූරදර්ශී චින්තනයෙන් නිර්භීත්වයෙන් මෙන්ම මානුෂියත්වයෙන් පිරිපුන්ව අප මාතෘභූමිය රුදුරු ත්‍රස්තවාදයෙන් මුදවාගැනීමට නායකත්වය දුන්නා වූද, මා කෙරෙහි දැඩි විශ්වාසයක් තැබූවා වූද, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත පුද කරමි.

සේනාධිනායක උතුමාණන්ගේ තීන්දු ජාතික ආරක්ෂක ක්ෂෙත්‍රයේදී ප්‍රායෝගික කාර්යයන් බවට පත් කර අප ත්‍රිවිධ හමුදාවේ සදා අමරණීය නාමයක් බවට පත්ව නිරන්තරයෙන්ම මට මඟ පෙන්වූ දිරිමත් කළ රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ගරු ලේකම් ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී මහතාණන් වෙත මා කෘතඥතාවය පුද කරනු ලබන්නේ ඉමහත් භක්ති ප්‍රණාමයෙණි.

එමෙන්ම, මෙයට හැටතුන් වසරකට පෙර අප යුද්ධ හමුදාවට ශක්තිමත් මූලාරම්භයක් ලබාදුන් මුල්ම යුද්ධ හමුදාධිපතිවරයාගේ සිට යුද්ධ හමුදාව මේ තත්ත්වයට ගොඩනැඟීම දක්වා ක්‍රියා කළ සියලුම යුද්ධ හමුදාධිපතිවරුන්ටත්, සියලුම නිලයන්ටත්, විශේෂයෙන්ම පශ්චාත් යුද්ධ සමයේ ව්‍යාකූල වූ අභියෝග ජය ගනිමින් උසස් වෘත්තීය හමුදාවක් මා වෙත භාර කළ හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරාල් ජගත් ජයසූරිය ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී වෙතත්, ගෞරවාචාරය පලකිරීමට මා මේ සම්භාවනීය අවස්ථාව උපයෝගී කර ගන්නෙමි.

අප මාතෘභූමියේ භෞමික අඛණ්ඩතාවය, ස්වෛරීත්වය මෙන්ම ඒකීයභාවය වෙනුවෙන් ප්‍රාණ දානයෙන් කැප වූ 24000 කට අධික මා සහෝදර රණවිරුවන්ද, කාය දානයෙන් කැප වූ 25000 කට ආසන්න සහෘදයන්ද, සේවා දානයෙන් අති විශිෂ්ට සේවයක් ලබා දුන්නා වූ ලක්ෂ සංඛ්‍යාත අපගේ අභිමානවත් රණවිරුවන්ට මා හට මේ සුවිශේෂී ජයග්‍රහනය ලබාගැනීමට ශක්තියක් වූ හෙයින් මා ඔවුන්ව මේ මොහොතේ සිහිපත් කරනුයේ අති විශේෂ වූ භක්ති ගෞරවාභිමානයෙනි.

මාගේ ජීවන ගමනට අයෝමය ශක්තියක් වූ මාගේ දයාබර දෙමව්පියන්, ගුරුදෙගුරුන් සහෝදර සහෝදරියන් හා කළ්‍යාණ මිත්‍රයන් සියලු දෙනාම මහත් භක්තියෙන් ආදරයෙන් යුතුව මේ මොහොතේ මෙනෙහි කරමි.

මාගේ දයාබර බිරිඳ සහ දරුවන් තිදෙනා සැමවිටම මා හට නිබඳවම සැපයූයේ කිව නොහැකි තරම් ධෛර්යයකි. ඔවුන්ව මෙම හැඟුම්බර මොහොතේ ආදරයෙන් සිහිපත් කරන්නෙමි.

මා හට නැණ ගුණ සහිත මූලික අධ්‍යාපන අඩිතාලම දැමීමටත්, අභියෝග ජයගෙන අධිෂ්ඨානයෙන්, අභීතව අරමුණ කරා යා හැකි නායකත්ව ගුණාංග වර්ධනය කර ගැනීමටත්, උදව් උපකාර වූ ගමේ පාසලෙත්, මලියදේව විදුහල් මාතාවගේ ගුරුදෙගුරුත් යුද්ධ හමුදා විද්‍යාපීඨයේ උපදේශකයිනුත් මේ මොහොතේ මා කෘතවේදීත්වයෙන් යුතුව සිහිපත් කරමි.

තරුණ ජව සම්පන්න හමුදා නිලධාරියෙකු ලෙස ශ්‍රී ලංකා පාබල හමුදාවට එක්වූ දා සිට වෘත්තීය ගමන් මඟේ හිති පෙත්සටම නැඟ ඒමට මා වෙත මහත් ශක්තියක් වූ පාබල හමුදාවේ මෙන්ම සමස්ත යුද්ධ හමුදාවේම සියලු නිලයන් මා මේ මොහොතේ සිහිගන්වන්නේ ඉමහත් භක්ති ප්‍රණාමයෙනි.

එමෙන්ම මේ සුවිශේෂී මොහොතේ මාගේ කෘතවේදීත්වයට පත්වන්නාවූ තවත් කණ්ඩායමක් වන්නේ අපගේ විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජික සාමාජිකාවන්, සිවිල් සේවක මහත්ම මහත්මීන් මෙන්ම අප හමුදා පවුල්වල ඥාතීන් ය. ඔබ සියලු දෙනාගේ ශක්තිය මෙන්ම ආශිර්වාදය අපව මෙම ජයග්‍රහනය කරා මෙහෙයවීමට සුවිශේෂත්වයක් වූවායි මා විශ්වාස කරමි. එබැවින් මාගේ හදපිරි ගෞරවය ඔබ වෙත මා පුද කර සිටින්නෙමි.

සියලුම සහෝදර යුද්ධ හමුදා සාමාජික සාමාජිකාවනි, එදා අප මාතෘභූමිය කැබලි වන්නට ගිය වකවානුවේදී මහින්ද චින්තනය ප්‍රතිපත්තියේ මූලධර්ම වලට අනුකූලව යමින් අප ජීවිතයට වඩා ආදරය කරන අපේ මාතෘභූමියට උපරිම කැපකිරීම් සිදු කර එක් ධජයක් යටතට ගෙන ඒමේදී මෙන්ම ආසියාවේ අශ්චර්ය කරා පරිසර හිතකාමී නිර්මාණාත්මකව පුද්ගලික මෙන්ම සමබර භෞතික සංවර්ධනයක් කරා ලෝකයේ උතුම්ම දේශය පියනගන මෙම වකවානුවේදී පෙර ගමන්කරුවා වීමට අප භාග්‍යවන්ත වීම දෛවෝපගත සිදුවීමක් ලෙස මා විශ්වාස කරමි.

මෙහිදී විදේශ ගතවී සිටින බෙදුම්වාදී අන්තවාදීන්ගෙන් එල්ල වන තර්ජන ප්‍රමුඛත්වයේලා සැලකිය හැකියි. තවද අප ඒකීය රටක් ලෙස සමාජ ආර්ථික ස්ථාවරභාවයෙන් යුක්තව ස්ථාවර දේශපාලන සංහිඳියාවක් කරා ජවසම්පන්නව සීඝ්‍රයෙන් ගමන් කරන මෙම වකවානුවේ අපගේ ජාතික ආරක්ෂාවට එල්ල වන අභියෝග නවතම මුහුණුවරකින් පැමිණීමට බොහෝ සේ ඉඩකඩ ඇත.

මෙම අභියෝග ජයගැනීම සඳහා අප දීර්ඝකාලීන යුද්ධයේදී ලද අත්දැකීම් උපරිම ප්‍රයෝජනයට ගෙන අවශ්‍ය දැනුම වර්ධනය කර ගැනීමේ නවීණ ක්‍රම වෙත අවධානය යොමුකර ප්‍රායෝගිකව අවශ්‍ය වන නව තාක්‍ෂණය ද, ප්‍රයෝජනයට ගනිමින් අප යුද්ධ හමුදාව අනාගතයට ගැලපෙන අයුරින් ප්‍රතිව්‍යුහගත කරලීමේ කාලීන අවශ්‍යතාවයට ප්‍රමුඛත්වයක් දෙන බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමි.

2009 මැයි මස 19 වෙනි දින සිට මේ දක්වා කාල පරාසය තුළ අප යුද්ධ හමුදාව වර්තමානයට සහ අනාගතයට ගැලපෙන අයුරින් ප්‍රතිසංවිධානය වීම, පුහුණුවීම සහ සන්නද්ධ වීම අතින් මෙන්ම හමුදාවේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, අපගේ මූලික අවශ්‍යතාවයන් ලබාගැනීම හා සුබසාධන කටයුතු වලදී විශාල ප්‍රගතියක් ලබාගෙන ඇත. පසුගිය වසර හතරක කාලය තුළ යුද්ධ හමුදාව ලබාගත් ජයග්‍රහන හිටපු යුද්ධ හමුදාධිපතිතුමා විසින් විස්තරාත්මකව එතුමා වෙනුවෙන් පැවැත්වුනු අවසන් සම්මාන පෙළපාළියේදී ප්‍රකාශ කරන්නට යෙදුණි.

මෙම ජයග්‍රහණ අපගේ අවශ්‍යතාවයන් සහ ඉලක්කයන් සපුරන තෙක්ම උසස් කළමණාකාරීත්වයකින් යුතුව ඉදිරියට පවත්වාගෙන යාම මගේ අදහස බැව් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනු කැමත්තෙමි. තවද ලෝකයේ නවීනතම අවි ආයුධ වලින් සන්නද්ධ ලෝකයේ බලවත්ම කණ්ඩායම් වලින් ආධාර අනුග්‍රහ ලබන ලොව දරුණුම ත්‍රස්තවාදීන් පරාජය කිරීම සඳහා අවි ආයුධ ගෙන්වූවද, විදේශ රටවලින් සුපිරි මිනිසුන් ගෙන්වූයේ නැති බැව් අභිමානයෙන් සිහිපත් කරමි. අපගේ මව්බිමේ උපන් ලක්‍ෂ සංඛ්‍යාත ගම්බද තරුණයන් තෝරාගෙන ඔවුන් සුපිරි මිනිසුන් බවට පත් කර ඔවුන් යුදබිමේ දී ලබාගත් සුවිශේෂී පුහුණුව ජාත්‍යන්තර මට්ටමේ කුසලතා සහ ආකල්ප වර්ධනය හේතුවෙන් තව දුරටත් අප හමුදාව ශ්‍රමික හමුදාවක් නොවන බැව් අවධාරණය කරනු කැමත්තෙමි.

තවද පශ්චාත් යුද සමයෙහි රටෙහි සංවර්ධන ක්‍රියාදාමයන් අභිමුඛව ඇති අභියෝග වලට මුහුණ දීමට අපි අවශ්‍ය පරිදි අනුගත විය යුතුය. එසේම අපගේ ඉලක්කගත පරමාර්ථ සපුරා ගැනීම සඳහා අප අලුතෙන් එකතු කර ගත් වෘත්තීය නිපුණත්වයන්, හැකියාවන් සහ කාර්යශූර බව ආපදා සහන මෙහෙයුම් වල දී ද, සිවිල් හමුදා සම්බන්ධීකරණ කටයුතු වල දී ද, තොරතුරු තාක්‍ෂණයේ දී ද, නව සංග්‍රාමික මෙහෙයුම් වල දී ද, සුබසාධන කටයුතු වල දී ද තවදුරටත් ශක්තිමත් කර ප්‍රවර්ධනය කළ යුතුය.

අද අපට කාලීන අවශ්‍යතාවයන් වී ඇත්තේ වෘත්තීය මට්ටමින් ඉතා උසස් ආදර්ශයෙන් පිරිපුන් විවිධ වූ හැකියාවන් සහ නිපුණත්වයන්ගෙන් සපිරි ඕනෑම අභියෝග වලට මුහුණ දිය හැකි ජව සම්පන්න විනය ගරුක යුද්ධ හමුදාවකි.

එවන් පරමාර්ථයක් ඉෂ්ට කර ගැනීම සඳහා ජාතික අවශ්‍යතාවය ප්‍රමුඛත්වයේ තබාගෙන අපගේ සියලු හැකියාවන් වැඩිදියුණු කර ගනිමින් නවීණත්වය එකතු කර අනවශ්‍ය දෑ බැහැර කරමින් සහ හොඳ දේ ආරක්‍ෂා කරගෙන අප ඉතා සමගි සම්පන්නව සහෝදරත්වයෙන් කටයුතු කළ යුතු බව මා මෙහිදී අවධාරණය කිරීමට කැමැත්තෙමි.

අද යුද්ධ හමුදාව යනු ශ්‍රමික හමුදාවක් පමණක් නොව රටක වටිනා මානව සම්පත් දායාද කරන සමාජයට නව ආකාරයේ ප්‍රායෝගික සංකල්ප බිහි කරන සහ ජාතිහිතෛෂී නව ආකල්ප ප්‍රවර්ධනය කරන්නා වූ වෘත්තීය මට්ටමින් උසස් ගුණාත්මක යුද්ධ හමුදාවක් ලෙස ඉදිරියට යමින් විශේෂ අගයන් ජාතික සංවර්ධනයට එකතු කළ හැකි විනය ගරුකම, සංවිධානාත්මක සංවිධානය බව මා දැඩිව විශ්වාස කරමි.

මෙහිදී තවත් වැදගත් කරුණක් පිළිබඳව ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි. එනම්, ජාතික අවශ්‍යතාවයන්ට ප්‍රමුඛත්වය දීම හේතුවෙන් ඉදිරියේදී ඇති විය හැකි ප්‍රතිපාදන සීමා කිරීම හේතුවෙන් අනාගතේදී අප සම්පත් වඩා හොඳින් කළමණාකරණය කිරීම වැදගත් ස්ථානයක් ගනු ඇත. ඒ හෙයින් ලැබෙන්නා වූ සීමිත සම්පත් අරපරිස්සමින් භාවිතා කිරීමද, අපතේ යැවීම අවම කිරීමද, අත්‍යාවශ්‍ය වේ. අපගේ මේ පරම ශක්තිය වනුයේ මිනිස් සම්පතයි. ඒ හෙයින් එම සම්පත් ඉතා සැළකිල්ලෙන් හා ඵලදායී ලෙස භාවිතා කිරීමට අපි සියලු දෙනාම උත්සුක විය යුතුය.

අපගේ මානව සම්පත් හි ගුණාත්මකභාවය උකහා ගැනීමටත්, අපේක්ෂිත පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමටත්, පාදක වශයෙන් සියලු අංශවලින් අප ලබන්නා වූ පුහුණුවයි. සංවර්ධනය හා සංහිඳියාව සිදු කෙරෙන මෙම පශ්චාත් යුද සමයේ පුහුණුව හා ඵලදායී ලෙස කටයුතු කිරීමට අවශ්‍ය අධ්‍යාපනය එකසේ නිලධාරියා, සෙසුනිලයා මෙන්ම සිවිල් සේවකයා ද, ලබාගත යුතුය. මෙම අධ්‍යාපන සාරධර්ම, ඇවතුම් පැවතුම්, ඉතිහාසය හා උරුමයන්, සංස්කෘතික ආචාර ධර්ම පද්ධතීන් සහ ජාතිකත්ත්ව ආදිය ඒකරාශී කොට ලබාදෙන්නක් විය යුතුය. තවද, අධ්‍යාපන අංශයෙන් ගත් කළ ත්‍රෛභාෂා අධ්‍යාපනය, පරිගණක සහ නව තාක්‍ෂණ දැනුම, ප්‍රායෝගික හමුදා පුහුණුව, නායකත්ව පුහුණුව වැනි අංශවලට ප්‍රමුඛත්වය දී කටයුතු කිරීමත් ඒ සඳහා අවශ්‍ය වන මූලික යටිතල පහසුකම් දියුණු කිරීමටත් මා ප්‍රමුඛත්වයක් දීමට කටයුතු කරමි.

රණවිරුවන්ගේ සුබසාධනය උදෙසා අතිගරු ජනාධිපතිතුමා, ගරු ආරක්‍ෂක ලේකම් තුමා සහ පොදුවේ සියලු රට වැසියාත්, ඉතා විශිෂ්ට වූ සහයෝගයක් රණවිරු පවුල්වලටත්, ආබාධිත රණවිරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලටත්, ජීවිත දානය දුන් රණවිරු පවුල්වලටත් නොමදව ලබාදෙති. මෙහි විශේෂත්වය වන්නේ යුද්ධය අවසාන වී වසර හතරකට පසුවත්, අඛණ්ඩව මෙම සහනශීලි සුබසාධන ව්‍යාපෘති ඔවුන් සැම වෙනුවෙන් ක්‍රියාකරවීමයි.

ගරු ආරක්‍ෂක ලේකම්තුමාගේ සංකල්පය මත බිහිවූ "මිහිඳු සෙත් මැඳුර" සහ "අපි වෙනුවෙන් අපි" නිවාස ව්‍යාපෘතීන් අපේ ඇගැයීමට හා පැසසුමට ලක් විය යුතුය. මේ හා අදාලව මාගේ පූර්වගාමියා වූ හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරාල් ජගත් ජයසූරිය ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් "අභිමන්සල" වැනි ව්‍යාපෘතීන් ඇති කරමින් සිදු කළ සුබසාධන කටයුතු මම වෙසෙසින් පසසමි. මාගේ මතය අනුව සංග්‍රාමයේදී මියගිය, ආබාධිත තත්ත්වයට පත්වුනු, දැනට සේවය කරන සහ විශ්‍රාමිකව පසුවන සියලු දෙනා වෙනුවෙන්ම සියල්ල එක්තැන් වූ පූර්ණ සුබසාධන ක්‍රමවේදයක් සකස් විය යුතුය. මන්ද යත් විශ්‍රාම යාම හේතුවෙන්ම ඔහු විසින් කැපවීමෙන් කරනු ලැබූ කර්තව්‍ය ප්‍රමාණාත්මකව හෝ වෙනත් ආකාරයකට ලඝු කිරීමට ලක් කළ නොහැකි බැවිනුත්, අප ලද විජයග්‍රහණයේදී එලෙස විශ්‍රාම ගිය පිරිස් ද විවිධ අවශ්‍යතාවයන් වලදී වටිනා මෙහෙයක් ඉටු කර ඇති හෙයිනුත් ය.

යුද්ධ හමුදා සොල්දාදුවෙකු වීම තව තවත් අර්ථවත් කරනුයේ ඔහුට හිමි ඉඳුම් හිටුම් පහසුකම්, ගුණාත්මක ආහාර, නිල ඇඳුම් සහ වෙනත් දෑ නිසි ලෙස ලැබෙනුයේ නම් පමණි. මෙම කරුණු කාරණා ගැන වඩා අවධානය යොමු කරන බවට ප්‍රතිඥා දෙමින් නිරන්තරව ඔබගේ සුබ සිද්ධිය වෙනුවෙන් කැපවන්නේ අති විශේෂ ප්‍රමුඛත්වයකින් බව මා මේ මොහොතේ අවධාරණය කරමි.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය සුබසාධක ක්‍ෂේත්‍රය වෙනුවෙන් මහගු වැඩ කොටසක් ඉටු කරනු ලබයි. එසේ වුවද, "මාතෘත්වය", "ගෘහණිය" සහ ඇගේ "ක්‍රියා පටිපාටිය" ප්‍රමුඛ කොට ගත් බිරිඳ හෝ මව යන සංකල්ප මෙම ඒකකය තුළින් ප්‍රගුණ කිරීමට මම අපේක්‍ෂා කරන අතර, සේවා වනිතා කාර්යභාරය ද නැවත ඇගැයීමකට ලක් කිරීමට බලාපොරොත්තු වෙමි.

අද වන විට අප සාමාජිකයන් දහසකට අධික සංඛ්‍යාවක් එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන් හි නිරතව සිටින අතර, ඔවුන් විසින් සිදු කරනු ලබන සේවය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිලධාරීන්ගේ මෙන්ම විදේශීය උසස් නිලධාරීන්ගේ ඇගැයීමට ලක්ව ඇත. ඉදිරියේදී මෙය තව දුරටත් ව්‍යාප්ත කර අප සාමාජිකයන් වැඩි සංඛ්‍යාවක් විදේශයන්හි සාමසාධක රාජකාරීන් හි යෙදවීමට අවශ්‍ය සැළසුම් සම්පාදනය කිරීම සඳහා අවැසි නායකත්වය හා මග පෙන්වීම ලබාදීමට කටයුතු කරමි.

ජාත්‍යන්තර හා ජාතික තලයේ දස්කම් දක්වමින් යුද්ධ හමුදා සාමාජිකයන් යුද්ධ හමුදාව ප්‍රතිස්ථාපිත වකවානුවේ සිටම ක්‍රීඩා ක්ෂේත්‍රයේ කැපී පෙනෙන කුසළතා දක්වමින් රටට හා අප සංවිධානයට මහත් කීර්තියක් අත්කර දී ඇත. පැරා ඔලිම්පික් ක්‍රීඩා තරගයන් හිදී ඔලිම්පික් පදක්කම් ලබාගනිමින් අප යුද්ධ හමුදා සාමාජිකයන් ක්‍රියා කළ ආකාරය මෙහිදී අප මතකයට නැගේ. කෙසේ වුවද, පසුගිය කාල සීමාවේදී අප හමුවේ තිබූ දැවැන්ත රාජකාරී බහුලත්වය හේතුවෙන් අප හමුදා ක්‍ෂේත්‍රයේ යම් පසුබෑමක් සිදුවූ බව අවිවාදයෙන් අප පිළිගත යුතුය. එසේ වුවද, ඉදිරියේදී වඩ වඩාත් පදක්කම් සහ විජයග්‍රහනයන් මෙම ක්‍ෂේත්‍රය තුළින් අපට ලබාගත හැකි වන පරිදි ජාත්‍යන්තර තලයට සමගාමීව අප ක්‍රීඩා ක්‍ෂේත්‍රයේ නැංවීම වැදගත් වේ. මේ වන විටද ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි තිම් වළළු පුළුල් කරමින් මෙම කාර්යයන් සඳහා වූ අවශ්‍ය පියවර ගනිමින් සිටින බව පවසනුයේ සතුටිණි.

යුද්ධ හමුදාව ඉදිරියට පියමන් කර ඇත්තේ සංඛ්‍යාත්මකව, ව්‍යුහාත්මකව හා යුධෝපකරණ සමග පමණක් නොවන අතර, එයට ආවේණික වූ වෘත්තීය විශිෂ්ටත්වය හා කීර්තිනාමය ද ඒ හා කැටුව ගොස් ඇත. අසමසම පරිත්‍යාගයන් තුළින් එලෙස ඇති කර ගත් ප්‍රතිරූපය සහ අභිමානය ආරක්‍ෂා කර ගැනීම අප සැමගේ පාරිශුද්ධ යුතුකම වනු ඇත.

තීරණාත්මක සහ පැහැදිළි මගපෙන්වීම පෙරමුණ කොටගෙන සියලු ඒකක වල ශක්තිය එකට කැටිකොට රාජකාරි සඳහා අවතීර්ණවීම මාගේ අණදෙන දර්ශණයේ ප්‍රබල සාධකයයි. එමෙන්ම ඔබට අවශ්‍ය තීරණ ගැනීම් අවශ්‍යතා වලදී ඍජු ලෙසම මාගේ මග පෙන්වීම නිරන්තරයෙන්ම ඔබ වෙත ලබාදීමට මම සූදානම් බැව් මේ අවස්ථාවේදී සිහිපත් කරමි.

දීර්ඝ කාලයක් තිස්සේ දරුණු ලේ වැගිරීම් වලින් මතුවන සමාජය විසින් ප්‍රතික්ෂේප කරන ලොව බොහෝ හමුදා මෙන් නොව, අප හමුදාවෝ ජනතාවගේ උපරිම ගෞරවයට, විශ්වාසයට හා කෘතඥතාවයට ලක්ව සිටින අතර, මෙම පරම සත්‍යය යුද්ධ හමුදාවක් ලෙස අප කිසිවිටකත් අමතක නොකළ යුතුය.

හමුදාවක සොල්දාදුවෙකුට තම හමුදාවට අණදීම තුළින් ලැබෙන්නාවූ ගෞරවය හා කීර්තියට වඩා වෙනත් ශ්‍රේෂ්ඨත්වයක් නොමැති බව සත්‍යයක් ලෙස පැවතෙතත්, මා ආදරය කරනු ලබන යුද්ධ හමුදාවටත්, සේවය කිරීමෙන් ලැබෙන ගෞරවය හා කීර්තිය මට ඊටත් වඩා වටිනා බව අවසන් වශයෙන් සනිටුහන් කිරීමට කැමැත්තෙමි.

මාගේ වෘත්තීය ජීවිතයේ සුවිශේෂතම අවස්ථාව වන මේ මොහොතේ මාගේ මේ පණිවිඩය අවසන් කිරීමට මා අපගේ අභිත සේනාධිනායකයාණන් වන අතිගරු මහින්ද රාජපක්‍ෂ ජනාධිපතිතුමාගේ ප්‍රකාශයක් ඔබ සියලු දෙනාටම මතක් කර දීමට කැමැත්තෙමි. මා මෙම ක්‍ෂේත්‍ර කියමන තොරාගත්තේ රටට අභිමානයවන් සොල්දාදුවාට මෙවැනි ඇගයීමකට හෝ ගෞරවාභිමානයකට ලොව කිසිම ජන නායකයෙක්, දර්ශණවාධියෙක්වත්, හමුදා නායකයෙක් හෝ වෙනත් කිසිම පඬිවරයෙකුගෙ න් ලැබී නොමැති බව මා තරයේ විශ්වාස කරන බැවිණි.

"වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව සහ පළිගැනීමේ මූලධර්ම මත පදනම් වූ රුදුරු අමාණුෂික ත්‍රස්තවාදයට මානුෂීය මෙහෙයුම තුළින් ජයගනු ලැබුයේ එක් අතකින් ගිණි අවිය ද, අනෙක් අතින් මානව හිමිකම් ප්‍රඥප්තියද, උරහිස මත මුදවා ගනු ලැබූ අහිංසක සිවිල් ජනතාවද, හදවතේ ආදරය, දයාව, අනුකම්පාව, මෛත්‍රිය සහ සෙනෙහස පුරවා ගත් අපගේ නිර්භීත සොල්දාදුවායි."

ඔබට ජය ශ්‍රී !

ඔබ සැමට තෙරුවන් සරණයි !

ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී
ලුතිතන් ජෙනරාල්
යුද්ධ හමුදාධිපති

2013 අගෝස්තු මස 01 වන දින

# දිගු ගමනක ආරම්භය



ආදරණීය දෙමව්පියන්



## ඉගෙනුම ලැබූ මලියදේව විදුහල

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැල්ලන්දෙණිය සියඹලන්ගමුව ග්‍රාමයේ පදිංචිව සිටි ගොවි පවුලක් වූ මුතුබණ්ඩා මහතාටත්, රන්මැණිකා මහත්මියටත්, දාව වර්ෂ එක්දහස් නවසිය පනස් අටේ පෙබරවාරි මස විසිවැනිදා ජන්ම ලාභය ලැබූ රත්නායක මුදියන්සේලාගේ දයා රත්නායක මූලික අධ්‍යාපනයට අත් පොත් තබන්නේ උඩබද්දලව මහ විද්‍යාලයෙහි.

එක් දහස් නවසිය හැත්තෑව වර්ෂයේ වැඩිදුර අධ්‍යාපනය සඳහා කුරුණෑගල මලියදේව විද්‍යාලයේ හයවන ශ්‍රේණියට ඇතුලත් වන මොහුගේ නම මලියදේව විදුහල් මාතාවගේ ඉතිහාස කතාවේ පිටු අතරේ ලියවෙන්නේ රන් අකුරිනි. මීටර් සියය හා හාරසියය ධාවන ඉසව් සඳහා ජයග්‍රාහකයා ලෙසින් ඇතුගල්පුරවරයේම ප්‍රසිද්ධියට පත් වෙමිනි. එක් දහස් නවසිය හැත්ත අට සහ හැත්ත නමය යන වර්ෂවල පාසලේ මලල ක්‍රීඩා නායකයා ලෙස දයා රත්නායක පත් වන්නේ යම් දිනයක ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ සභාපතිවරයා වන බව පසක් කර නොග නිමිනි. විද්‍යාලයේ කනිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යභට කණ්ඩායමේ නායකත්වය දැරීම යුද හමුදාවේ හිනිපෙත්තටම නැගීමට මූලික හැඩතල නිර්මාණය වීමක් බව ඉතා පැහැදිලි කරුණකි. ජව සම්පන්න කණ්ඩායම් ක්‍රීඩාවක් වන රග්බි පාසල් ක්‍රීඩා කණ්ඩායමේ නායකත්වය දැරීම මොහුගේ අභිමානවත් ඉදිරි ගමනේ පෙර දැක්මක් ලෙස සනිටුහන් කළ හැක.

අදටත් ශ්‍රී ලංකා මාධ්‍ය ක්ෂේත්‍රයේ සුපතල නිහතමානි, චතුර මාධ්‍ය ප්‍රකාශක ලෙස ප්‍රකට වන්නට පාසලේ විවාද කණ්ඩායමේ නායකයා වීමෙන් පන්නරය උපයෝගි වූවාට විවාදයක් නොමැති අතර, එය ''ලොවෙන් එකෙක් එක් දෙයකට වෙයි සමත'' යන පැරණි කියමණ සපත නොවීමක් ලෙස දැක්විය හැක.

පාසලේ සෑම අතින්ම හා සෑම අංශයකින්ම කැපී පෙනුණු මේ කීර්තිමත් සිසුවා උසස් පෙළින් පසුව මලියදේව මාතාවගෙන් සමුගන්නේ ඉන් ලද පන්නරය තම දේශය වෙනුවෙන් ලබාදීම සඳහා ස්වකීය ආදී සිසුන් බහුතරයක් තෝරාගත් මාවතට පිවිසීම සඳහායි.



# මලියදෙව් මාතාවගෙන් යුද හමුදාවට පැමිණි දයා රත්නායක

තම පාසලේ ලද පන්නරය සමඟින් උත්තුංග දේශදාරී ප්‍රශන්න පෙනුමක් ඇති දයා රත්නායක මලියදේව විද්‍යාලයේ වැඩි පිරිසක් තෝරාගත් මාවත තෝරාගන්නා ලදී. ඒ අනුව 1980 පෙබරවාරි මස 06 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය බළසේනාවේ කෙඩෙට් නිලධාරියෙකු ලෙස බැඳී යුද හමුදා පුහුණුව අංක 13 කෙඩෙට් නිලධාරී පාඨමාලාව යටතේ යුද හමුදා විද්‍යා පීඨය දියතලාව වෙතින් හදාරන ලදී. මූලික යුද පුහුණුව වසර එකහමාරක් සාර්ථකව නිමකර 1981 ජුලි මස 18




යුද හමුදා පුහුණුව ලබන අවධියේදී


වන දින අධිකාරි පත්වීම් ලබා එවකට නිත්‍ය පාබල ඒකකයක් වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ පළමුවන බළඇණිය වෙත ඇතුළත් කරන ලදී.

දෙවන ලුතිතන් ආර්එම්ඩී රත්නායක ශ්‍රීලපාහ ඒකකය සමඟින් යාපනයේ ප්‍රදේශයේ රාජකාරි කරමින් සිටිය දී 1983 ජූලි මස 23 වන දින මුර සංචාරය රාජකාරි සිදු කිරීම සඳහා කණ්ඩායම් දෙකක් කඳවුර දෙපසට ගමන් කරන ලදී. එක් කණ්ඩායමක් කන්කසන්තුරය දක්වා ගමන් කිරීමට සිදු වූ අතර, එහි නායකත්වය දෙවන ලුතිතන් වාස් ගුණවර්ධන විසින් හොබවන ලදී. අනික් කණ්ඩායම දෙවන ලුතිතන් දයා රත්නායක විසින් හොබවන ලද අතර, එහි ගමන් මාර්ගය වූයේ යාපනය දූරකථන හුවමාරු මධ්‍යස්ථානය වෙත ගොස් නැවත පැමිණීමයි. මෙදින ලක්බිම සිදු වූ ආන්දෝලාත්මක සිදුවීමක් වූයේ රුදුරු ත්‍රස්තවාදීන් විසින් මඟ රැකසිට තිරුනල්වේලි හිදී ප්‍රහාරයක් එල්ල කිරීමයි. එම ප්‍රහාරයේදී දෙවන ලුතිතන් වාස් ගුණවර්ධන ඇතුලු රණවිරුවන් දහතුන් දෙනකු ජීවිතක්ෂයට පත් විය. එම සිදුවීම ඉතිහාස ගත වුවත් ඒ පිළිබඳව විමසා සිටීමට ජීවමාන සාක්ෂිකරු ලෙස සේවයේ යෙදී සිටින්නේ අනික් මුර සංචාරයේ සිටි දෙවන ලුතිතන් දයා රත්නායක පමණි.

යාපනය අරියාල ප්‍රදේශයේදී රාජකාරි කළ ලුතිතන් දයා රත්නායක තම නායකත්වය ලබාදුන් ඛණ්ඩය සමඟින් වරක



පුහුණු පාසලේදී ඛණ්ඩභාර නිලධාරි ලෙස



ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරයකට ලක් විය. එම ප්‍රහාරයේදී තමන් සමඟ සිටි රණවිරුවන් දෙදෙනෙකු මියගොස් තවත් සිව් දෙනෙකු තුවාල ලබන ලදී. ඉතිරි අයවලුන්ට සමඟ ත්‍රස්තවාදීන්ට එළව එළවා ප්‍රහාර එල්ල කරමින් ත්‍රස්තවාදීන් තිස්හත් දෙනෙකු මරා දමන්නට ලුතිතන් දයා රත්නායක විශිෂ්ට නායකත්වයක් ලබා දෙන ලදී. මෙම වීර ක්‍රියාව යුද හමුදාව තුළ රැව් පිළිරැව් දුන් සිදුවීමක් විය. එමෙන්ම සතුරා පන්න පන්නා ප්‍රහාර එල්ල කිරීමට මෙයද හේතු සාධක වන්නට ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපති අතිගරු ජේආර් ජයවර්ධන ශ්‍රීමතානන්ගේ ප්‍රධානත්වයෙන් 1986 ඔක්තෝබර් මස 06 වන දින යුද හමුදා මූලස්ථානයේදී ප්‍රථම වීර පදක්කම් ප්‍රදානෝත්සවය සිදු කරන ලදී. මෙම උත්සවයේදී වීර පදක්කම් වලට හිමිකම් කීවේ විසිතුන් දෙනෙකු පමණි. එම වීරුවන් විසිතුන් දෙනා අතුරින් ඉහළම වීර පදක්කම වන "රණවික්‍රම පදක්කම" හිමිකර ගත්තේ ලුතිතන් දයා රත්නායකය.

1 ශ්‍රීලපාහ ඒකකය සමඟින් රාජකාරි කරමින් සිටියදී කමාන්ඩෝ පුහුණු පාඨමාලාවක් ගනේමුල්ල කඳවුර දී ද, සාමූහික පුහුණුවීම් පාඨමාලාවක් අම්පාර සටන් පුහුණු පාසලෙන් පමණක් නොව ඉන්දියාවේ දී පාඨමාලාවන් හදාරා ඒකකයේ බුද්ධි නිලධාරි, සහයක විධායක අධිකාරි මෙන්ම ආධාරක කණ්ඩායමේ වැඩ බලන නිලධාරි අණදෙන ලෙසින් රාජකාරි කර ඇත.

# විසිවන යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී නව තනතුරේ වැඩ භාරගැනීම















නව යුද හමුදාපතිතුමාට ශ්‍රී ලංකා පාබල හමුදාවෙන් ලබාදුන් සම්මාන පෙළපාළිය

ශ්‍රී ලංකා යුද හමුදා වර්ණ ධජයන්ට ආචාරය දක්වමින්





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් ලද ආචාරයට සමාචාරය දක්වමින් ...

නව තනතුරට පත් වුවත්, මංගල හස්තියා වෙත චාරිත්‍රානුකූල කෘතගුණ දක්වමින් ...



# අතිගරු ජනාධිපති උතුමානන්ගෙන් නව තනතුරට ආශිර්වාද ...





යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් දයා රත්නායක 2013 අගෝස්තු මස 01 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ උතුමානන් හමු වී ආශිර්වාදය ලබාගන්නා ලදී.

එම අවස්ථාවට යුද හමුදාපති තුමන්ගේ ආදරණීය බිරිඳ දමයන්ති රත්නායක මැතිනිය හා පුතුණුවන් දෙදෙනා හා එකම දියණියද සහභාගි විය. මෙම මොහොත සිහිවීමට යුද්ධ හමුදාධිපති තුමන් අතිගරු ජනාධිපති උතුමානන් වෙත සමරු සිහිවටනක් ලබාදීමට ද අමතක කළේ නැත. එම සුවිශේෂී අවස්ථාව කැමරා කාචයේ සනිටුහන් වූ අයුරු...



# ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් හමු වූ නව යුද්ධ හමුදාධිපති තුමන්



රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශයේ ගරු ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් බැහැ දකීමට ද නව යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී අමතක කළේ නැත.





# විසිවන යුද්ධ හමුදාධිපති තනතුරේ රාජකාරි ආරම්භ කරමින් හටපිරිස් ඇමතීම




යුද හමුදා සාමාජිකයෙකුට ලබාගැනීමට හැකි උපරිම ගෞරවය වන යුද්ධ හමුදාධිපති ධූරය භාරගන්නා මේ මොහොතේ මාගේ හද පතුලෙන්ම නැගී එන විශේෂ කෘතවේදීත්වයෙන් පිදුම් ලබන්නේ දූරදර්ශී චින්තනයෙන් නිර්භීතත්වයෙන්, වාගේම මානුෂීයත්වයේ පිරිපුන්ව අප මාතෘභූමිය රුදුරු ත්‍රස්තවාදීන්ගෙන් මුදාගැනීමට නායකත්වය දුන් මා කෙරෙහි දැඩි විශ්වාසයක් තැබුවා වූ අප සේනාධිනායක ශ්‍රීමත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමායි. කෘතවේදීත්වයෙන් පමණක් නොව හද පත්ලෙන් නැගෙන ගෞරවයෙන්, භක්තියෙන්, අප සේනාධිනායකයාණන් නිරන්තරයෙන් ගෞරව ලබන බව මා කිව යුතුයි. අප සේනාධිනායක උතුමාණන්ගේ තීන්දු ජාතික ආරක්ෂක ක්ෂේත්‍රයේදී ප්‍රායෝගික කාර්යයක් බවට පත්කර, අප ත්‍රිවිධ හමුදාව සදා අමරණීය නාමයක් බවට පත්ව නිරන්තරයෙන් අපට මග පෙන්නා දිරිමත් කළ රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ගරු ගෝඨාභය රාජපක්ෂ මහතාණන් වෙත මා කෘතඥතාව පුදකරනු ලබන්නේ ඉමහත් භක්ති ප්‍රණාමයෙනි. එමෙන්ම මෙයට [illegible] වසරකට පෙර අප හමුදාවට ශක්තිමත් මූලාරම්භයක් ලබා දුන් මුල්ම හමුදාධිපතිවරයාගේ සිට යුද හමුදාව මේ තත්ත්වයට ගෙන නැගීමට ක්‍රියා කළ සියලුම හමුදාපතිවරුන්ටත්, සියලුම නිලයින්ටත්, විශේෂයෙන් පසුගිය යුද සමයේ වගකීම් වූ අභියෝග ජයගනිමින් උසස් වෘත්තීය හමුදාවක් මා වෙත භාර කළ හිටපු යුද්ධ හමුදාපති ජෙනරාල් ජගත් ජයසූරියටත්, ගෞරවනීය ප්‍රණාමය පල කිරීමට මා මේ ගෞරවනීය අවස්ථාව උපයෝගී කර ගනිමි.

අප හමුදාව ප්‍රාණ දානයෙන්, කාය දානයෙන්, මෙන්ම සේවා දානයෙන් මහා පරිත්‍යාග කළ අතර, මාතෘභූමියේ භෞමික අඛණ්ඩතාවය ස්වෛරීත්වය වෙනුවෙන් ප්‍රාණ දානයෙන් උපරිම කැප කිරීම් කළ 24000 කට අධික මා සහෝදර රණවිරුවන්, කාය දානය කළ 25000 කට ආසන්න සහෘද්ධයන්, සේවා දානයෙන් තම අති විශිෂ්ට සේවාව ලබා දුන්නාවූ ලක්ෂ සංඛ්‍යාත රණවිරුවන් අති විශේෂ ජයග්‍රහන ලබාගැනීමට සුවිශාල ශක්තියක් වූ බව මේ මොහොතේ මා සිහිකරන්නේ අති විශේෂ වූ ගෞරවාභිමානයෙන් යුතුවයි. එමෙන්ම මාගේ ජීවන ගමනට අයෝමය ශක්තියක් වූ මාගේ දයාබර දෙමාපියන්, ගුරු දෙගුරුන්, සහෝදර සහෝදරියන් හා කළ්‍යාණ මිත්‍රයින් සියලු දෙනාම මහත් භක්ත්‍යාදරයෙන් යුතුව මේ මොහොතේ මෙණෙහි කරමි. මාගේ දයාබර බිරිඳ සහ දරුවන් තිදෙනා සැම විටම මාහට නිබදව සැපයුයේ කිව නොහැකි තරම් ධෛර්යයක් වන අතර, මෙම හැඟුම්බර මොහොතේ ඔවුන්ද ආදරයෙන් සිහිපත් කළ යුතුයි.

නැණ ගුණ සහිත මූලික අධ්‍යාපන අඩිතාලම දමා අභියෝග ජයගෙන අධිෂ්ඨානයෙන් අභීතව අරමුණ කරා යා හැකි නායකත්ව ගුණාංග වර්ධනය කර ගැනීමට උදව් උපකාර වූ ගමේ පාසල මෙන්ම මලියදේව විදුහල් මාතාවගේ ගුරු දෙගුරුන්, යුද හමුදා විද්‍යාපීඨයේ උපදේශකයින් මේ මොහොතේ මා මතකයට පැමිණ කෘතවේදීත්වයේ වචන වලින් සළකනු ලැබීම නොවැළැක්විය හැකි කරුණක් වන්නේය. තරුණ ජවසම්පන්න හමුදා නිලධාරියෙකු වශයෙන් ශ්‍රී ලංකා පාබල හමුදාවට එක්වූ දා සිට වෘත්තීය ගමන් මගේ හිණිපෙත්තටම නැග ඒමට මා හට මහත් ශක්තියක් වූ පාබල හමුදාව සහ සමස්ත හමුදාවේම සියලු නිලයින් මේ මොහොතේ සිහි ගන්වන්නේ ඉමහත් භක්ති ප්‍රණාමයෙනි. තවද, මෙම සුවිශේෂී මොහොතේ මාගේ කෘතවේදීත්වයට පාත්‍ර වන්නේ අපගේ විශ්‍රාමික හමුදා සාමාජික සාමාජිකාවන්, යුද හමුදා සිවිල් සේවක මහත්ම මහත්මීන්, සහ අප හමුදා පවුල් වල ඥාතීන් ය. ඔබ සියලු දෙනාගේ ශක්තිය මෙන්ම ආශීර්වාදය මෙම ජයග්‍රහනය කරා පැමිණීමට මහත් පිටිවහලක් වූවායි මා විශ්වාස කරමි. එබැවින් මගේ සුවිශේෂී ගෞරවය ඔබ වෙත පුද කර සිටිමි.

අද දින ගෞරවනීය සන්රාජ, අලංකාර හා ක්‍රමවත් පෙළපාළියක් මේ අවස්ථාවේ මා වෙත සංවිධානය කර ඉදිරිපත් කළ සියලුම නිලයින්ට සහ එහි නායකත්වය ගත් අභිනව මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ක්‍රිශාන්ත සිල්වා, විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් ජගත් ඩයස්, ඇතුළුත් සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින් මා මේ අවස්ථාවේ ඉතාමත්ම ගෞරව පූර්වකව සිහිපත් කරමි. මේ දින කිහිපය තුළ උදේ සිට හවස් වරුව දක්වා හමුදාවේ පැවරීම සහ භාරගැනීම් උත්සවයන් වලදී සුවිශේෂ මාධ්‍ය ආවරණයක් කළ අපගේ මාධ්‍ය සගයින් සියලු දෙනාටත්, අද මෙතනට පැමින සිටින සියලු දෙනාටත්, මාගේ ගෞරවය විශේෂයෙන් යුද හමුදාව වෙනුවෙන් ඔබ වෙත පුද කර සිටිමි. මේ දින වන විට යුද හමුදා මූලස්ථානය යම් කිසි පරිවර්තනයකට මුහුණ දෙන අවස්ථාවක් වන අතර, ස්ථාන මාරුවීමක් සිදු වෙමින් පවතී. හමුදාවේ භෞතික සම්පත් වෙනත් ස්ථානයකට ගෙන යන හේතුවෙන් හමුදා මූලස්ථානය තුළ සියලු කටයුතු සිදු කිරීමට අවශ්‍ය පහසුකම් නොමැත. එබැවින් මේ ක්‍රීඩා මණ්ඩපය, ක්‍රීඩා භූමිය සපයාදුන් අයවලුන් සහ සීඑච් ක්‍රීඩා සමාජයේ අයිතිකරුවන්, මෙහෙයවන්නන් සහ කළමනාකාරීත්වයේ සියලුම අයවළුන්ට යුද හමුදාව වෙනුවෙන් මේ අවස්ථාවේ මා කෘතවේදීත්වය පල කරමි.

මා හමුදාවට බැඳුනු සමයේ මේ රටේ ජාතික ධජය මුළු රටේම ඔසවන්න පුළුවන් හැකියාවක් තිබුණු නමුත් කාලයාගේ ඇවෑමෙන් එය රටේ එක කොටසකට පමණක් සීමා විය. එහෙත් දශක ගණනාවක් තුළ ජීවිත පරිත්‍යාගයෙන් සේවය කිරීමෙන් අනතුරුව අද එය මුළු දේශයේම එසවීමට හැකියාව ලැබී ඇත. ජාතික ධජය අභිමානයෙන් යුතුව රැකගැනීම සඳහා දායක වුනු අපි සියලු දෙනා අද අපගේ කාර්යය කුමක් දැයි සොයා බැලිය යුතුයි. මේ ජාතික ධජයට ලෝක අවධානය සහ ශ්‍රී විභූතිය ගෙන ඒමට අපි සැම කැප විය යුතුයි. අප මාතෘභූමිය අසියාවේ ආශ්චර්ය බවට පත් කිරීමේ ශ්‍රේෂ්ට කාර්යයට දායක වෙමින් සිටී. එදා අප මාතෘභූමිය එක් සේසත් කිරීමට වේගයෙන් ඉදිරියට ගිය අප හමුදාව වේගවත් අනාගත ගමනක යෙදී ඇත. වර්තමානයට සහ අනාගතයට ගැලපෙන අයුරින් ප්‍රතිසංවිධානය වීම, පුහුණුවීම සහ සන්නද්ධ වීම අතින් මෙන්ම යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ සුබසාධන කටයුතු වලදී විශාල ප්‍රගතියක් ලබාගෙන ඇත. මෙම වසර හතරක කාලය තුළ හමුදාව ලබාගත්



ජයග්‍රහන, හිටපු හමුදාපතිතුමා විසින් විස්තරාත්මකව එතුමාගේ අවසන් දේශනයේ දී මෙම ස්ථානයේදී ම දින කීපයකට පෙරදී විස්තර කරන ලදී.

එම ජයග්‍රහන අපගේ අවශ්‍යතාවයන් සහ ඉලක්කයන් සපුරාලන තෙක්ම උසස් කළමනාකාරීත්වයකින් යුතුව ඉදිරියට පවත්වාගෙන යාම මාගේ අදහස බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමි. ලෝකයේ නවීනතම අවි ආයුධ වලින් සන්නද්ධ, ලෝකයේ බලවත්ම කණ්ඩායම් වලින් ආධාර අනුග්‍රහ ලබන ලොව දරුණුතම ත්‍රස්තවාදීන් පරාජය කිරීම සඳහා අවි ආයුධ විදේශ රටවලින් ආනයනය කළද, කිසිම විටක සුපිරි මිනිස් බලය ලබා ගත්තේ නැත. උපන් බිමේ ලක්‍ෂ සංඛ්‍යාත තරුණ තරුණියන් තෝරා ඔවුන් සුපිරි මිනිසුන් බවට පත්කරන ලදී. ඔවුන් යුද්ධයේ දී ලබාගත් සුවිශේෂ පුහුණුව ජාත්‍යාන්තර මට්ටමට නැංවූ කුසලතා, ආකල්ප දියුණුව නිසා තව දුරටත් අප හමුදාව ශ්‍රමික හමුදාවක් නොවන්නේය. අද ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ශ්‍රමික හමුදාවකින් ඔබ්බට ගොස් ලෝකයට, සමාජයට නව ආකාරයේ ප්‍රායෝගික සංකල්ප බිහිකරන සහ නව ආකල්ප ප්‍රවර්ධනය කරන්නා වූ විශේෂ අගයන් ජාතික සංවර්ධනයට එකතු කළ හැකි මාතෘභූමියේ තිබෙන විනය ගරුකම සංවිධානය බව මා දැඩිව විශ්වාස කරමි. එය තව දුරටත් දියුණු කිරීම වාගේම තියුණු කිරීම මාගේ අභිමතාර්ථයයි. ඵලදායි ලෙස කටයුතු කිරීමට අවශ්‍ය අධ්‍යාපනය නිලධාරියා, සෙසුනිලයා මෙන්ම සිවිල් සේවකයා ද එකසේ ලබාගත යුතුයි. හමුදාව තුළ ලබන අධ්‍යාපනය යුද්ධය සඳහා ලබන වෘත්තීය පුහුණුවක් නොවේ. එය සාරධර්ම, ඇවතුම් පැවතුම්, ඉතිහාසය හා උරුමයන්, සංස්කෘතික ආචාර ධර්ම පද්ධතීන් සහ ජාතිකත්වය ඒකරාශී කොට ලබාදෙන සුවිශේෂ ජීවිත ගොඩ ගැනීමකි. චරිත ගොඩනැගීම සඳහා ත්‍රෛභාෂා අධ්‍යාපනය, පරිගණක සහ නව තාක්‍ෂණය දැනුම, ප්‍රායෝගික හමුදා පුහුණුව, නායකත්ව පුහුණුව වැනි අංශ වලට ප්‍රමුඛත්වයදී කටයුතු කරන අතර, ඒ සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් දියුණු කිරීමටත්, ප්‍රමුඛත්වයක් ලබාදෙන බවත් කිව යුතුය. එබැවින් ලැබෙන්නා වූ සීමිත සම්පත් අර පරිස්සමින් භාවිතා කිරීමද, අපතේ යැවීම් අවම කිරීමද, අවශ්‍යතාවයයි. අපගේ පරම ශක්තිය වනුයේ මිනිස් සම්පතයි. එබැවින් එම සම්පත ඉතා සැළකිල්ලෙන් හා ඵලදායි ලෙස භාවිතා කිරීමට අප සියලු දෙනාම උත්කෘෂ්ට විය යුතුය. අප හමුදාව මාතෘභූමියේ බොහෝ ක්‍ෂේත්‍ර වලට ආදර්ශයක් බවට පත්ව ඇත. ලංකාවේ බුද්ධිමය කේන්ද්‍රස්ථානය වන විශ්ව විද්‍යාල පද්ධතියට ද අප ලබාගත් දැනුම, අත්දැකීම් පිළිබඳව ආකර්ෂණය යොමුව තිබෙන බව ඔබ සියලු දෙනාම දන්නා කරුණකි. රණවිරුවන්ගේ සුබසාධනය උදෙසා අතිගරු ජනාධිපතිතුමන්, ආරක්‍ෂක ලේකම්තුමන් සහ පොදුවේ සියලු රට වැසියාත් ඉතා විශිෂ්ට වූ සහයෝගයක් ලබාදෙන රටක් තුළ සේවය කිරීමට භාග්‍ය ලැබීමට අපි සැම වාසනාවන්ත වී ඇත. එමෙන්ම අබාධිත රණවිරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලටත්, ජීවිත දානය දුන් රණවිරු පවුල්වලටත්, කිසිදු අඩුවක් නැතිව සුභසාධනයන් ලබාදෙන බව මා මේ අවස්ථාවේ සඳහන් කළ යුතුය. මෙහි විශේෂත්වය වන්නේ යුද්ධය අවසාන වී වසර හතරකට පසුවත් නොඅඩුවම මෙම සහනශීලි ව්‍යාපෘති ඔවුන් සැම වෙනුවෙන් ක්‍රියා කරවීමයි. මෙහි විශිෂ්ටත්වය වන්නේ ලොව ඉහළම සුබසාධනයක් ලබන හමුදාව ශ්‍රී ලංකා හමුදාව වීමය. ආරක්‍ෂක ලේකම්තුමාගේ සංකල්පය මත බිහිවූ ''මිහිඳු සෙත් මැඳුර'', ''අපි වෙනුවෙන් අපි'' නිවාස ව්‍යාපෘතීන් සහ මාගේ පූර්වගාමියා වූ හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරාල් ජගත් ජයසූරිය විසින් ''අභිමන්සල'' වැනි ව්‍යාපෘති ඇති කරමින් සිදු කළ සුබසාධන කටයුතු මා වෙසෙසින් පසසමි. යුද සංග්‍රාමයේදී මියගිය, ආබාධිත තත්ත්වයට පත්වුනු දනට සේවය කරන සහ විශ්‍රාමිකව පසුවන සියලු දෙනා වෙනුවෙන්ම සියල්ල එක්තැන් වුනු පූර්ණ සුබසාධන ක්‍රමවේදයක් සකස් කිරීම මාගේ අභිප්‍රායයි. හමුදාවෙන් විශ්‍රාම යාම නිසාම ඔවුන් සේවයේදී කැපවීමෙන් කරනු ලැබූ කර්තව්‍ය ලඝු කිරීමකට ලක් කළ නොහැකිය. එමෙන්ම විශ්‍රාම ගිය අයවලුන් ද, හමුදා ඉතිහාසයේ විවිධ අවස්ථාවලදී වටිනා මෙහෙයක් ඉටු කර ඇති බව මා කිව යුතුය. ඒ කළ කැපකිරීම් අද අප ලද විජයග්‍රහනයේ කොටසක් වේ. හමුදා සොල්දාදුවෙකුට උවමනා ඉඳුම් හිටුම් පහසුකම් ගුණාත්මක ආහාර ඇඳුම් පැළඳුම් සහ නිල ඇඳුම් ද, වෙනත් දෑ ද නිසිලෙස ලැබිය යුතුය. එය ඔහුගේ උදාරත්වයට හේතුවක් වන්නේය. මෙම කරුණු කාරණා ගැන වඩා අවධානය යොමු කරන බවට ප්‍රතිඥා දෙමින් නිරන්තරයෙන්ම ඔවුන්ගේ සුබ සිද්ධිය වෙනුවෙන් කැපවන්නේ අති විශේෂ ප්‍රමුඛත්වයකින් බව මා මෙහිදී ප්‍රකාශ කර සිටිමි.

යුද හමුදා සේවාවනිතා ඒකකය සුබසාධන ක්‍ෂේත්‍රය වෙනුවෙන් මහඟු වැඩ කොටසක් ඉටු කරන බව අපි සැම දන්නා කරුනක් වේ. ''මාතෘත්වය'', ''ගෘහණිය'' සහ ඇයගේ ක්‍රියාපටිපාටිය ප්‍රමුඛ කොටගත් ''බිරිඳ'' සහ ''මව'' යන සංකල්ප මෙම ඒකකය තුළින් ප්‍රගුන කිරීමට මා අපේක්‍ෂා කරන අතර, සේවාවනිතා කාර්යභාරයද නැවත ඇගැයීමකට ලක් කිරීමට ද බලාපොරොත්තු වෙමි.

ලොව දරුණුතම ත්‍රස්තවාදීන්ට එරෙහිව දුවැන්ත යුද මෙහෙයුම් වල යෙදුනු අප හමුදාව එක රැයකදී මහජන සුබ සිද්ධිය සළසන මහා මානුෂීය හමුදාවක් බවට පත්වීමට තරම් නම්‍යශීලි සංවිධානයක් බව අපි සියලු දෙනාම දන්නා කරුණකි. වසර 30ක් පුරා රටේ තිබුනු යුදමය තත්ත්වය ඉතා ඉක්මණින් වෙනස් කර රට සාමාන්‍ය තත්ත්වයට ගෙන ඒමට අප සේනාධිනායකයා ප්‍රමුඛ රජයට හැකිවූයේ එම හේතුව නිසාය. මේ රටේ සංවර්ධන ක්‍රියාදාමයන් හමුවේ ඇති අභියෝග වලට මුහුණ දීමට අවශ්‍ය පරිදි අනුගත වීමට ශ්‍රී ලංකා යුද හමුදාව සූදානම්ය. එලෙසම අපගේ ඉලක්කගත පරමාර්ථ සපුරාගැනීම සඳහා අප අලුතින් එකතු කරගත් වෘත්තීය නිපුණත්වයන්, හැකියාවන් හා කාර්යශූර බව ආපදා සහන මෙහෙයුම් වල දී ද, සිවිල් හමුදා සම්බන්ධීකරණ කටයුතු වලදී ද, තොරතුරු තාක්‍ෂණයේදී ද, නව සංග්‍රාමික මෙහෙයුම්වල දී ද, සුබසාධන කටයුතු වලදී ද, තව තවත් ශක්තිමත් කර ප්‍රවර්ධනය කළ යුතුය.

යුද හමුදා සාමාජිකයන් යුද හමුදාව ප්‍රතිස්ථාපන වකවානුවේ සිටම ක්‍රීඩා ක්‍ෂේත්‍රයේ කැපී පෙනෙන කුසලතා දක්වමින් රටට හා අප සංවිධානයට මහත් කීර්තියක් අත් කර දී ඇත. පැරා ඔලිම්පික් ක්‍රීඩා තරගයේදී ඔලිම්පික් පදක්කම් ලබමින් අප හමුදා සාමාජිකයින් ක්‍රියා කළ ආකාරය මෙහිදී අප මතකයට නැගෙන අතර, පසුගිය කාලසීමාවේදී අප හමුදාවේ තිබූ දැවැන්ත රාජකාරී බහුලත්වය හේතුවෙන් අපගේ හමුදා ක්‍රීඩා ක්‍ෂේත්‍රයේ පසුබෑමකට ලක් වූ බව අවිවාදයෙන් පිළිගත යුතුය. එසේ වුවද ඉදිරියේදී වඩ වඩාත් පදක්කම් සහ විජයග්‍රහනයන් අපට ලබාගත හැකි වන පරිදි ජාත්‍යන්තර තලයට සමගාමීව අප ක්‍රීඩා ක්‍ෂේත්‍රය දියුණු කිරීම වැදගත් කරුනකි. මේ වන විටත් ක්‍රීඩා ක්‍ෂේත්‍රයේ නිම් වළලු පුළුල් කරමින් මෙම කාර්යය කිරීමට


අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර ඇත. මේ සියල්ල අප මාතෘභූමියේ උදාරත්වයට හේතු වන අතර, උදාර බව අප ජීවිත අභිමානයටත් හේතු වේ. එම අභිමානය වෙනුවෙන් ජීවිතය පූජා කර පුරුදු අප ජාතික ආරක්‍ෂාවට තව දුරටත් දැඩි අවධානය යොමු කළ යුතුය. තවද, අප ඒකීය රටක් ලෙස සමාජ ආර්ථික ස්ථාවර භාවයෙන් යුක්තව ස්ථාවර දේශපාලන සංහිඳියාවක් කරා ජව සම්පන්නව සීඝ්‍රයෙන් ගමන් කරන මෙම වකවානුවේ අපගේ ජාතික ආරක්‍ෂාවට අභියෝග එල්ල වෙන්නේ නවතම මුහුණුවරකින් බව සියලු දෙනාම මතකයේ තබාගත යුතුය. මෙම අභියෝග ජයගැනීමට නම් අප දීර්ඝ කාලීන යුද්ධයේ ලද අත්දැකීම් උපරිම ප්‍රයෝජනයට ගැනීමට සිදු වේ. අවශ්‍ය දැනුම වර්ධනය කිරීමට නව ක්‍රම උපයෝගී කර ගනිමින් අවශ්‍ය වන තාක්‍ෂණය ද, ප්‍රයෝජනයට ගෙන අනාගතයට ගැලපෙන අයුරින් ප්‍රතිව්‍යුහ ගත කරලීමේ කාලීන අවශ්‍යතාවයට මා ප්‍රමුඛත්වයක් දෙන බව මා මෙහිදී ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. යුද හමුදාව ඉදිරියට පියමන් කර ඇත්තේ සංඛ්‍යාත්මකව, ව්‍යුහාත්මකව හෝ යුධෝපක්‍රම සහිතව හෝ නොවේ. එයට ආවේණික වූ වෘත්තීය විශිෂ්ටත්වය හා කීර්තිනාමය ද ඒ හා කැටුව ගොස් ඇත. අද වන විට අප සාමාජිකයින් දහසකට අධික සංඛ්‍යාවක් එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදා රාජකාරීන්හි නිරතව සිටින අතර, ඔවුන් විසින් සිදු කරනු ලබන සේවය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිලධාරීන්ගේ මෙන්ම විදේශීය උසස් නිලධාරීන්ගේ ද ඇගැයීමට ලක්ව ඇත. අප ගොඩ නගා ඇත්තේ ලෝක සාමයටත් සේවය කළ හැකි කාර්යශූර බුද්ධිමත් හමුදාවක්ය. ඉදිරියේදී මෙය තව දුරටත් ව්‍යාප්ත කර අප සාමාජිකයින් වැඩි සංඛ්‍යාවක් හට විදේශයන් හී සාමසාධක රාජකාරීන් සඳහා යෙදවීමට අවශ්‍ය සැළසුම් සම්පාදනය කිරීමට මා ප්‍රමුඛත්වයක් දී කටයුතු කරමි. තීරණාත්මක සහ පැහැදිළි මග පෙන්වීම පෙරමුණ කොට ගෙන සියලු ඒකකවල ශක්තිය එකට කැටි කොට රාජකාරි සඳහා අවතීර්ණ වීම මාගේ අණදෙන දර්ශනයේ ප්‍රබල සාධකයකි. එමෙන්ම ඔබට අවශ්‍ය තීරණ ගැනීමේ අවස්ථා වලදී ඍජු ලෙසම මාගේ මග පෙන්වීම නිරන්තරයෙන් ඔබහට ලබාදීමට මා සූදානම් බවද මතක් කරමි.


දීර්ඝ කාලයක් තිස්සේ දරුණු ලේ වැගිරීම් වලින් මතු වන, සමාජය විසින් ප්‍රතික්ෂේප කරන ලොව බොහෝ හමුදාවන් මෙන් නොව, අප හමුදාව ජනතාවගේ උපරිම ගෞරවයට, විශ්වාසයට සහ කෘතඥතාවයට ලක්ව ඇත. මෙම පරම සත්‍ය යුද හමුදාවක් ලෙස අප කිසිවිටකත් අමතක නොකළ යුතුය. සොල්දාදුවෙකුට තම හමුදාවට අණදීම තුළින් ලබන්නාවූ ගෞරවය හා කීර්තියට වඩා වෙනත් ශ්‍රේෂ්ටත්වයක් නොමැති බව සත්‍යක් ලෙස පැවතියත්, මා ආදරය කරනු ලබන යුද හමුදාවට සේවය කිරීමෙන් ලැබෙන ගෞරවය හා කීර්තිය මට ඊටත් වඩා වටිනා බව අවසන් වශයෙන් පවසමි.

අප සේනාධිනායක උතුමාණන් මාතෘභූමිය වෙනුවෙන් කැප වූ හමුදාවේ කිසිවෙක් කවර බලවේගයක් හමුවේ වුවද පාවා නොදෙන අභීත නායකයෙකු වීම මේ මොහොතේ අපට මහත් ධෛර්යයකි. අපි මනුෂ්‍යත්වය වැළඳගෙන සේවය කරමු. ම්ලේච්ඡත්වයේ අභියෝග වලින් දේශය ගලවා ගනිමු. මේ අවස්ථාවේ ඉතාමත්ම කාලෝචිත කවි පද දෙකක් සිහි ගන්වනු ලබන අතර, සෙබළුන් විසින් නිරන්තරව බංකර් තුළ ලියා තිබුනි. "මිතුරෝ එතොත් දූවිලි වුව වැළඳ ගනු - සතුරෝ එතොත් මෙර ගිර වුව පසිඳලනු" අප වීරෝදාර හමුදාව එබඳු වන අතර, පසු ගිය දශක තුනක පමණ කාලය තුළ මෙය ඉතාමත් සක්සුදක් සේ ලොවටම ප්‍රදර්ශනය කරන ලදී. වෙනත් සංවිධානයක් යුද්ධයට පැමිණෙණ අවස්ථාවේ යුද්ධ කිරීමටත්, සාමයට එන අවස්ථාවේ සාමයට කථා කිරීමත්, හැකියාව තිබුනු හමුදාවක් බව මුලු සමස්ත ලෝකයටම අපි විදහා පෑවේය. එල්ටීටීඊ සංවිධානය වේවා, අනෙකුත් අය වේවා, එම සියලු දෙනා සමඟ සාමකාමීව වැඩ කිරීමට අප හමුදාව දිරිමත් විය. එලෙසම සාමකාමී නොවී යුද්ධයට පැමිණෙණ අවස්ථාවේ සිදු වූ දෙය ඔබ සියලු දෙනාම නොරහසකි. 2009 මැයි මස 19 වන දින සිදු වූයේ එවැන්නකි. මහමෙර උවත් ඉදිරියට එන විට එය වැරදි නම් එය කඩා බිඳ දමා ඉදිරියට යාමට පුළුවන් හමුදාවක් සිටින බව සමස්ත ශ්‍රී ලංකාවේ ඔබ සියලු දෙනාටම ඉතාම අභිමානයෙන් මා ප්‍රකාශ කරමි. මාගේ වෘත්තීය ජීවිතයේ සුවිශේෂතම අවස්ථාව වන මේ මොහොතේ මාගේ කථාව අවසන් කිරීමට මා අපගේ අභීත සේනාධිනායක අතිගරු ජනාධිපතිතුමාගේ කියමනක් ඔබ සියලු දෙනාට මතක් කිරීමට කැමැත්තෙමි. මා මෙය මේ අවස්ථාවේ තෝරාගත්තේ රටක අභිමානවත් සොල්දාදුවාට මෙවැනි ඇගැයීමකට හෝ ගෞරවාභිමානයකට ලොව කිසිම ජනනායකයෙක් හෝ දර්ශනවාදියෙක් හෝ හමුදා නායකයෙක් හෝ වෙනත් කිසිම පඬිවරයෙක් වෙතින් ලැබී නොමැති බව මා තරයේ විශ්වාස කරන බැවිණි.

"වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව සහ පළිගැනීමේ මූලධර්මය මත පදනම් වූ රුදුරු අමානුෂික ත්‍රස්තවාදය මානුෂීය මෙහෙයුම් තුළින් ජයගනු ලැබුවේ එක් අතකින් ගිණි අවිය ද, අනෙක් අතින් මානව හිමිකම් ප්‍රඥප්තිය ද, උරහිස මත මුදවා ගනු ලැබූ අහිංසක සිවිල් ජනතාව ද, හදවතේ ආදරය දයාව, කරුණාව, මෛත්‍රිය, අනුකම්පාව සහ සෙනෙහස ද පුරවාගත් අපේ නිර්භීත සොල්දාදුවා යි."

මෙය අතිගරු ජනාධිපතිතුමාගේ සුවිශේෂී වූ කියමනකි. ලොවේ කිසිම සොල්දාදුවෙකු හට මෙවැනි ගෞරවාභිමානයක් කිසිම ජනනායකයෙකු වෙතින් ලැබී නොමැත. එවන් උදාර සම්පතක් ඇති අප ලක්බිමට එමෙන්ම උදාර හමුදාවක් ඇති අප මව්බිමට කිසිම අභියෝගයක් අභියෝගයක් නොවන බව අවසාන වශයෙන් ප්‍රකාශ කරමින් ඔබ සියලු දෙනාටම "ජයශ්‍රී කියා" ඔබ සැමට තෙරුවන් සරණ පතමින් මා නිහඬ වෙමි.





# ශ්‍රී දළදා සමිඳුන්ගේ ආශිර්වාදය ලබමින්...






ලුතිතන් ජෙනරාල් දයා රත්නායක මැතිඳුන් නව තනතුරට ආශිර්වාදය ලබා ගැනීම සඳහා සම්මා සම්බුදුරජානන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේ වැඩ සිටින මහනුවර ශ්‍රී දළදා මාළිගාවට ගොස් වැඳපුදා ගන්නා ලදී. ඉන් පසු මල්වතු අස්ගිරි පාර්සවයේ මහා නාහිමියන් බැහැ දුක ගරු සගරුවනගේ ද, ආශිර්වාදය ලබා ගන්නා ලදී.









# ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේගෙන් ආශිර්වාදය ලබමින් ...

අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ වැඳ ආශිර්වාදය ලබාගෙන ඉන් පසු රුවන්වැලි මහා සෑ රදුන් වැඳපුදා ගෙන ආශිර්වාදය ලබා ගන්නා ලදී.



# රණවිරු ස්මාරකයට ගෞරව ප්‍රණාම
# දිවි දුන් විරුවන් සිහි කිරීම







# නව යුද හමුදාධිපති තුමාගේ මිහිඳු සෙත් මැඳුරේ සංචාරය





නව තනතුරේ රාජකාරී භාරගැනීමෙන් පසු එදින රාත්‍රියේ මිහිඳු සෙත් මැඳුරේ ආබාධිත රණවිරුවන්ගේ සුවදුක් විමසා ඔවුන් සමඟින් රාත්‍රී ආහාර ගැනීමෙන් අනතුරුව ත්‍යාග පාර්සල් ද ලබාදී කෘත ගුණ දක්වීමෙන් අප හැමදෙන වෙත ලබා දුන්නේ මහඟු ආදර්ශයකි.





# Lt Gen RMD Ratnayake WWW RWP RSP USP ndu psc
# Sri Lanka Light Infantry's 6th Army Commander

I have been invited to send a message on the assumption of Command of the Sri Lanka Army by Lt Gen RMD Ratnayake, may be because I happen to be the most senior SLLI Officer living in Sri Lanka.

At the outset I wish to state that I had the privilege of serving under the first four Army Commanders produced by the CLI when they commanded 1CLI, namely the late Maj Gen AM Muttukumaru OBE ED, the late Maj Gen HWG Wijeyekoon OBE ED, the late Maj Gen Deshamanya AR Udugama MBE, and the late Maj Gen BR Heyn.

The fifth Army Commander Gen SHS Kottegoda WWV RWP RSP VSV USP ndc, presently Ambassador to Thailand was one of my subalterns when I was Commanding Officer 1CLI. Although Lt Gen Ratnayake was commissioned as a Second Lieutenant in 1981 I first met him in my work place in the Private Sector just after my retirement in 1984.



I distinctly remember he introduced himself, and needless to say I was very impressed with his keenness in wanting to know all about the CLI from a Veteran of the CLI. We had a long chat and thereafter he used to meet me more often.

Since then I have been following his career very closely. I have read the article which appeared in the Daily news on 1st August 2013, the day he assumed Command of the Sri Lanka Army; I fully endorsed its contents and in particular, I quote "his patience and steady rise to the office of Commander after serving the Army for more than 33 years is largely attributable to a combination of many factors like leadership, discipline, intellectual skills, principled stand and more distinctively due to the respect and admiration he has for his peers".

A case in point is his steadfast loyalty to his first Commanding Officer Lt Col Tony Rajudin who has this to say "Truly, the 9th of August, 2013 will be the most important day in my civilian life when I was remembered and honoured by one of my subalterns who is now the Commander of the Sri Lanka Army. Saying so, may I take this opportunity to thank General Daya Ratnayake for remembering me and making me feel elated amongst an elite crowd of Regimental Major Generals and Brigadiers at the felicitation Dinner with me being seated closest to the Head Table".

I was invited by the Lt Gen Daya Ratnayake to Cocktails on 8th August 2013 to celebrate his promotion to the rank of Lt General and appointment as Commander of the Army.

My son who is more CLI than myself who was holidaying in Sri Lanka at the time with his wife and daughter was very keen to meet the new Army Commander. Without so much as a Telephone call to the General or his ADC I took them along with me to the Officers' Mess Regimental Headquarters SLEME. He was delighted to meet them, and in fact came along with the Secretary Defence Gothabaya Rajapakse to where we were seated and spent some time with us. This shows the caliber of the person, a lesson in humility, thoughtfulness, and kindness.

Daya Ratnayake had more or less to fight his way to uphold his principled stand on certain official matters with a belligerent former Army Commander who harassed him. These were only pin pricks as far as Daya Ratnayake was concerned. What the issue was I cannot now remember, but to what level the former Army Commander has fallen in now history. He has taken to politics in a big way, and is new head of a Party whose membership could easily fill a Bajaj Three Wheeler.

Gen Daya Ratnayake is a visionary who sees things that others cannot see. Take for instance the Memorial he built for our fallen War Heroes which is now nearing completion. It is something out of the ordinary. He has also been on active supporter of the CLI Association, of which I was its Chairman for just over 10 years. He is fully aware that he will also be an Ex-serviceman one day which some people fail to see. I now wish to conclude this rather long message in the hope that I have done justice to a true and loyal son of the Sri Lanka Infantry.

Maj Gen HV Athukorale VSV psc FBIM (Retd)
9 Sept 2013

# රෙජිමේන්තු අභිනන්දන...

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවෙන් බිහි වූ සවැනි යුද්ධ හමුදාධිපති මෙන්ම ශ්‍රී ලංකා යුද හමුදාවේ විසිවන යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී 2013 අගෝස්තු මස 09 වන දින තම පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ අභිමන් දැක්වීමේ උත්සව සඳහා සහභාගිවන ලදී.

එහිදි රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඩීජේ කරුණාසේකර ආර්එස්පී යූඑස්පී පීඑස්සී විසින් පිළිගන්නා ලද අතර, නව යුද්ධ හමුදාධිපතිතුමා වෙත පාබල හමුදා රෙජිමේන්තුවෙන් සම්මාන මුරයක් හා වර්ණ ධජ සහිත සම්මාන පෙළිපාළියක් පිරිනමා රෙජිමේන්තු ආචාරයන් සිදු කරන ලදී.

බළලත් නිලධාරී සහ සැරයන් නිවස්නාය වෙතින් යුද්ධ හමුදාධිපතිතුමා වෙත තේ පැන් සංග්‍රහයක් පිරිනැමූ අතර, එහිදී රෙජිමේන්තු සැරයන් මේජර් විසින් සිහිවටනයක් ද පිරි නමන ලදී.

නිලධාරීන් සහ සෙසුනිලයින් 1500 කට අධික ශ්‍රීලපාහ විරුවන් ඇමතීම රසල් හයින් ක්‍රීඩා පිටියේදී සිදු කළ අතර, ඉන් අනතුරුව රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නවතමයෙන් ඉදි කරන ලද වොලිබෝල් ක්‍රීඩා පිටිය විවෘත කරන ලදී. එදින දිවා භෝජන සංග්‍රහය සියලු නිලයින් එකතුව එතුමන් සමගින් පවත්වන ලදී.

එදින රාත්‍රියේ නිලධාරී නිවස්නයේ රෙජිමේන්තු නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සමග රාත්‍රි භෝජන සංග්‍රයක් පවත්වන ලද අතර, ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති විසින් යුද හමුදාධිපතිතුමන් වෙත සමරු තිළිනයක් ද ප්‍රදානය කරන ලදී.

























# Great Commanders produced by the Sri Lanka Light Infantry

## Major General AM Muttukumaru OBE ED



| | |
|---|---|
| Born | 6 July 1908 Ceylon |
| Died | 2001 Australia |
| Years of service | 1934 - 1959 |
| Rank | Major General |
| Unit | Ceylon Light Infantry |
| Commands held | Commander of the Ceylon Army (1955- 1959)<br>Chief of Staff of the Ceylon Army |
| Battles/wars | World War II |
| Awards | Order of the British Empire (OBE)<br>(Military Division), Efficiency Decoration,(ED) |
| War Medal | 1939–1945,Ceylon Armed Services Long Service Medal |
| Other work | High Commissioner to Australia,<br>Pakistan and Ambassador to Egypt |

Born to Dr. Philip Marian Muttukumaru and Mary Mount Carmel Alles, he and his siblings were brought up by their mother after the early death of their father. Educated at home by an English governess and then at St. Joseph's College, Colombo, he then entered University College, Colombo and in 1928, he left for Jesus College, Oxford to read Philosophy, Politics and Economics. After completing his degree, he read for the Bar and was called by Gray's Inn to become a Barrister. After returning to Ceylon, he took his oaths as an Advocate of the Supreme Court of Ceylon.

In 1939 he was mobilized with the rest of the CDF at the outset of World War II. During this time, he would go on to command the CLI Guard at the South East Asia Command headquarters in Kandy. On 1 November 1943 he was promoted Lieutenant Colonel and appointed Commanding Officer, 2nd Battalion CLI in which appointment he continued to serve until the general demobilization which took place after the War.In 1996, the General Sir John Kotelawela Defence Academy awarded an 'Honourable Doctor of Letters' to him for his contributions to the buildup of the Army and for being the first to publish a short history of the Army. The Military History of Ceylon An Outline ISBN 81-7013-046-8. Muttukumaru died in Australia in 2001 at the age of 93.

## Major General HWG Wijeyekoon OBE ED



| | |
|---|---|
| Born | 25 June 1911 |
| Died | April 1969 (aged 57) |
| Allegiance | Ceylon |
| Service/branch | Ceylon Defence Force<br>Ceylon Army |
| Rank | Major General |
| Unit | Ceylon Light Infantry |
| Commands held | Commander of the Ceylon Army<br>(01st Jan. 1960 - 31st Dec. 1963) |
| Battles/wars | World War II |
| Awards | Order of the British Empire (OBE) (Military Division),<br>Efficiency Decoration,(ED) |
| Other work | High Commissioner to Pakistan, Ambassador to Italy |

He was the eldest son of Sir Gerard Wijeyekoon, former President of the Senate of Ceylon and Lady Wijeyekoon. Educated at St Joseph's College, Colombo and University of Oxford gaining a BA. Later he became an advocate of the Supreme Court of Ceylon and became a Land Settlement Officer.

He was commissioned as a Second Lieutenant in the Ceylon Light Infantry in 1935. With the break of World War II and the mobilization of the Ceylon Defence Force. He was posted to the 3rd Battalion, Ceylon Light Infantry and underwent tactical training in India. At the end of the war he was demobilized in 1946.

Following Ceylon's independence in 1948 Prime Minister, D.S. Senanayake selected Lt. Col. Wijeyekoon to serve as Secretary to the Chief Whip in the House of Representatives.

With the formation of the Ceylon Army in 1949, Lt. Col. Wijeyekoon joined the regular army in 1950. He became the commanding officer of the 1st Battalion, Ceylon Light Infantry and he was the first commanding officer of the regiment. During this time he started the tradition of toasting the motherland or the queen with arrack. In January 1954 he took up the post of Chief of Staff of the Ceylon Army. and was appointed as the first Commandant of the Ceylon Volunteer Force from 1956 to 1959. During his service he introduced Sinhalese for parade ground commands and formed the Army Hewisi Band of oriental music. He was the second Ceylonese Commander of the Ceylon Army from 1960 to 1963.

# Major General AR Udugama MBE



| | |
|---|---|
| **Born** | **Matale** |
| **Died** | **1995** |
| **Military service** | **Allegiance Sri Lanka** |
| **Service/branch** | **Ceylon Defence Force Ceylon Army** |
| **Years of service** | **1940-1966** |
| **Rank** | **Major General** |
| **Unit** | **Ceylon Light Infantry, Ceylon Sinha Regiment** |
| **Commands** | **Commander of the Ceylon Army (1964-1966)** |
| **Battles/wars** | **World War II** |
| **Awards** | **MBE, Burma Star, Defence Medal, War Medal 1939–1945** |

He was born on 11 November 1911 in Matale to a rich family, who claimed to be linked to the Uva Rebellion. Educated at Trinity College, Kandy and won the The Trinity Lion.

With the out break of World War II, he joined the Ceylon Defence Force and was commissioned as a Second Lieutenant in the Ceylon Light Infantry in 1940. Thereafter he was posted to the 1st, 3rd and 4th Battalions of the Ceylon Light Infantry and undertook several infantry courses in Ceylon and India. In November 1943, he was transferred to the British 14thh Army operating in Burma Campaign. During this time he served with the 7/2nd Punjab Regiment in the Arakan area, on the eastern side of Mayu Range. At this point he was captured Japanese and held in a POW camp until the end of the war in 1945. For his war service he was awarded the Burma Star, the Defence Medal and the War Medal 1939–1945. After the war, he was demobilized and became a planter. However he joined the new Ceylon Army when it was established in 1949 as a regular officer with the rank of Major.

The government of Sri Lanka bestowed the title of Deshamanya and on his death in 1995 a State funeral was granted with full Military honours.

# Major General BR Heyn



| | |
|---|---|
| **Born** | **October 1, 1912** |
| **Died** | **February 3, 1998** |
| **Allegiance** | **Sri Lanka** |
| **Service/branch** | **Ceylon Defence Force Ceylon Army** |
| **Years of service** | **1940 -1967** |
| **Rank** | **Major General** |
| **Unit** | **Ceylon Light Infantry** |
| **Commands held** | **Commander of the Sri Lankan Army (1966-1967)** |
| | **Chief of Staff of the Sri Lankan Army** |
| **Battles/wars** | **World War II** |
| **Awards** | **War Medal 1939 -1945** |
| **Other work** | **President of the Board of Control for Cricket in Sri Lanka** |

He was educated at Royal College, Colombo and played for the cricket team at Royal College, debuting in 1930 and played in the Royal-Thomian. He played for the Ceylon cricket team and his most famous feat was getting Sir Donald Bradman out on his last appearance in Colombo, in an unofficial Test match between Australia and All-Ceylon on 27 March 1948. Bradman was able to score only 20 runs before being caught out by R.L. de Kretser off Heyn's bowling. Heyn also played hockey. He graduated from the Staff College, Camberley and the Imperial Defence College.

He joined the Ceylon Defence Force and was commissioned as a Second Lieutenant in the Ceylon Light Infantry before World War II. When the Ceylon Army was formed in 1949 he was commissioned as a Major in the regular force. In the early 1950s he took command of the Ceylon Light Infantry with as a Lieutenant Colonel.

For wartime service, he had earned the War Medal 1939 –1945, and for service in the Ceylon Army, he received the Ceylon Armed Services Long Service Medal, the Queen Elizabeth II Coronation Medal and the Ceylon Armed Services Inauguration Medal.

In his later years he managed the Sri Lanka cricket team and served as the head of the Cricket Board, as well as on the Sri Lanka Olympic Council.

# General SHS Kottegoda WWV RWP RSP VSV USP ndc

| | |
|---|---|
| Born | November 6, 1949 Kottegoda, Southern Province |
| Service/branch | Sri Lanka Army |
| Years of service | 1970 - 2005 |
| Rank | General |
| Unit | Sri Lanka Light Infantry |
| Commands held | Commander of the Army (1 July 2004 - 5 December 2005) |
| Battles/wars | 1971 JVP Insurrection<br>1987–89 JVP Insurrection<br>Sri Lankan Civil War |
| Awards | WWV, RWP, RSP, USP, PBP, VOM, (partial list) |
| Other work | Sri Lankan Ambassador to Brazil and Ambassador to Thailand |



General Shantha Kottegoda, WWV, RWP, RSP, VSV, USP was a Sri Lankan Army officer and the Seventeenth Commander of the Sri Lankan Army from 1 July 2004 – 5 December 2005. He was the former Sri Lankan Ambassador to Brazil and current Sri Lanka Ambassador to Thailand.

Shantha Kottegoda has served the Sri Lankan Army for 35 years in throughout the island. He has been involved in both the 1971 and 1987–89 JVP Insurrection as well as the Sri Lankan Civil War, participating in major operations against the LTTE in the North and East of the country. Kottegoda has held numerous positions in the Army, among them he was Colonel of the Regiment of the Sri Lanka Light Infantry, General Officer Commanding in Jaffna, General Officer Commanding 51 Division in Vavuniya. He has been Director of Training, Director Military Intelligence and Director General, Training at Army Headquarters.

Early life Kottegoda was born to S. H. P. Kottegoda and Sheela Kottegoda on 6 November 1949, in Kottegoda, Matara, in the Southern Province of Sri Lanka. Kottegoda started his schooling at St. Aloysius' College, Galle and then moving to S. Thomas' College, Mount Lavinia in Grade.He was active in many sports including cricket, athletics, hockey, rifle shooting, swimming, water polo and others, in which he excelled. He had become a cadet and by 1964 was Lance Sergeant of the junior Cadet Platoon, receiving the junior Cadet Prize for special merit that year. By 1969 he was promoted to the rank of Company Quarter Master Sergeant as well as being appointed a School Prefect, and Head Prefect of Buck House. It was this commitment to sport and discipline that prepared him for his career in the military.

Kottegoda enlisted into the Sri Lankan Army in February 1970, upon his completion of his Officer Cadet training at the Sri Lanka Military Academy, Diyatalawa, then called the Army Training Centre. He was commissioned as a Second Lieutenant in the 1st Battalion of the Ceylon Light Infantry in June 1971. One of his reasons to joining the Army was so that he could continue to play sports. Quoted as saying "Taking part in sports, I gained confidence, improved my leadership qualities and I was fit both physically and mentally. It helped me to take decisions quickly and promptly." He also said the training he gained from playing sport taught him of fair play, justice and discipline.

His rise through the military ranks saw that in 1973 he was promoted to Lieutenant, Captain 1976, Major 1980, Colonel 1991, Brigadier 1993 and Major General in 1998. From 2000 to 2002, he was the Security Forces Commander in Wanni. He served as Assistant & Deputy Director of the Counter Terrorist Division, National Intelligence Bureau and Commanded the Fourth Battalion Sri Lanka Light Infantry. In 2003 he was the Duputy Chief of Staff of the Sri Lanka Army for two months, October to November. On November 24, 2003 He was appointed Chief of Staff of the Sri Lanka Army.

# REMINISCENCE OF
# LT. GEN. RMD RATNAYAKE WWV RWP RSP USP ndu psc
## COMMANDER OF THE SRI LANKA ARMY WHEN STILL A SECOND LIEUTENANT



As the Commanding Officer of the 1st Battalion Sri Lanka Light Infantry in 1981 when Second Lieutenant R. M. D. Ratnayake joined the Battalion after receiving his commission, I am indeed happy and proud that one of my subalterns have reached the most exalted position of Commander of the Sri Lanka Army in the rank of Lieutenant General with effect from 01st of August 2013, after 32 years of dedicated service to the Army and of course to our Motherland, Sri Lanka. I am also happy to learn that Lieutenant General R. M. D. Ratnayake becomes the 6th Officer from the Light Infantry to achieve this position of Commander of the Sri Lanka Army, whilst also being the 20th Commander of the Sri Lanka Army.

Remembering the past after nearly half a century, it is indeed a gigantic task to reflect on any significant event that I could think of with a fading memory at 76 years of age, but as far as my memory could recollect, as a young subaltern Daya Ratnayake was clearly outstanding amongst the rest of his colleagues. What struck me most was his keen initiative, precision of intellect, his ability in accomplishing whatever tasks assigned to him with grit and determination, fairness of outlook, incorruptible character with a strong charming personality. These qualities which were inherent in him, I consider are the factors that would have helped him to overcome whatever obstacles he may have had to face in his path to reach this exalted position of Commander of the Sri Lanka Army in the rank of Lieutenant General.

His humble character inherent in him is proved by the fact that on the morning of the 9th August, 2013, when he paid his very first visit to the Sri Lanka Light Infantry Regimental Headquarters at Panagoda on being appointed as Commander of the Sri Lanka Army, after he was accorded the Ceremonial Guard of Honour, he had occasion to remember his first Commanding Officer and personally telephoned me and inquired about my health etc., I was so proud and happy over this humble gesture of the Commander of the Sri Lanka Army Lieutenant General R. M. D Ratnayake WWV RWP, RSP, USP,ndu, psc remembering his first Commanding Officer and in turn I very humbly offered my sincere congratulations on his appointment as Commander of the Sri Lanka Army and indicated to him how proud I was as his First Commanding Officer to know that one of my subalterns is now commanding the Sri Lanka Army.

After General Ratnayake's telephone call before I could even recover from the shocked state that I was in, I received another call from someone identifying himself as an Officer from 1SLLI inquiring from me the directions to my place of residence stating that he has been tasked to hand over personally an invitation to be present at a Regimental Dinner the same evening at the Regimental Officers' Mess at Panagoda to felicitate the Commander of the Army Lt General RMD Ratnayake . It was subsequently that I found out that General Ratnayake had himself given directions that I be invited as a Special Guest for the Felicitation Dinner. Although I had other engagements that evening due to the day being 'Eid-ul-Fitr' Festival Day, I had to accept the invitation in honour of one of my subalterns who is now the Commander of the Sri Lanka Army.

General Ratnayake's upbringing and conduct is exemplified by the fact that when he arrived for the felicitation dinner at the Regimental Officers' Mess that evening, no sooner than he alighted from his official car at the Officers' Mess, he had inquired whether I was present, and when the reply was in the positive, he walked directly towards where I was standing and extending a warm welcome thanked me most sincerely for being present at such short notice. He even noticed the Regimental Tie that I was wearing and since it was an earlier issue, he made sure that I was presented with the new Regimental Tie together with two pair of Regimental Cuff Links, which kind gesture I will never forget. His simplicity and humbleness was further amplified when he himself called for the official photographer to take a picture of himself with me during fellowship.

Truly, the 9th of August, 2013 will be the most important day in my civilian life when I was remembered and honoured by one of my subalterns who is now the Commander of the Sri Lanka Army. Saying so may I take this opportunity to thank General Daya Ratnayake for remembering me and making me feel elated amongst an elite crowd of Regimental Major Generals and Brigadiers at the felicitation Dinner with me being seated closest to the Head Table.

I finally extend my Congratulations and Best Wishes to General Daya Ratnayake for every success in his appointment as the Commander of the Sri Lanka Army.

**Lt Col (Retd) T. M. Rajudin SLLI**

# 6 ශ්‍රීලපාහ ඒකකයට අණදී යුද්ධ හමුදාධිපති තනතුරට පත් වූ හමුදාධිපතිතුමා ගේ ඒකක සහ රණබිමේ මතක සටහන්

වර්ෂ 1990 ක් වූ ජූනි මස 08 වන දින ශ්‍රී ලංකා යුද හමුදාවටත්, ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවටත්, විශේෂිත වූ දිනයක් බවට සනිටුහන් කරමින් ''හයවන ශ්‍රී ලංකා පාබල හමුදාව'' නමින් මෙම ඒකකය ගොඩනැංවෙද්දී එහි ආරම්භක අණදෙන්නා වශයෙන් එවකට ''මේජර් ඩී රත්නසභාපති ශ්‍රීලපාහ නම් කර තිබූ අතර, ආරම්භක අණදීමේ කාළසීමාව 1990.06.08 දිනෙන් පටන් ගෙන 1993.01.28 දිනෙන් අවසන් විය.



1993.01.28 දින වන විට මෙම ඒකක හටපිරිස් බළඇණි සාමූහික පුහුණුවීම් සඳහා හොරොව්පොතාන යුද හමුදා කඳවුර වෙත අවතීර්න වී සිටි අතර, ඒකකය වෙතින් සමුගෙන යන අණදෙන නිලධාරි තුමන්ට ගෞරව දැක්වීමටත්, ඒකකයේ නව අණදෙන නිලධාරි තුමන් වශයෙන් රාජකාරි භාරගැනීමට පැමිණෙන නව අණදෙන නිලධාරි තුමන් වෙත සුබ පැතුම් එක්කර පිළි ගැනීමටත්, සියලු කටයුතු සැලසුම් විය. 1993.01.28 දින ඒකකය වෙත පැමිණි මේජර් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ එදින 0638 පැයට යෙදී තිබූ සුබ මොහොතේ දී ඒකකයේ රාජකාරිත් භාර ගැනීමට කටයුතු කරන ලද අතර, බළඇණියේ දෙවනියට පත්වන අණදෙන නිලධාරි ලෙස අණදීම භාරගත් නිලධාරි වශයෙන් ඒකක ඉතිහාසයට එක්වූ බව මෙහිදී සටහන් කර තබනුයේ ඉතා අභිමාණයෙනි. නව අණදෙන නිලධාරි ඒ වන විට ප්‍රගුණකර තිබූ සුවිශේෂී වූ අත්දැකීම්ද උපයෝගී කරගනිමින් බළඇණියට පැවරෙන රාජකාරින් ඉටු කිරීම සඳහා ඒකක හටපිරිස් නිසි අන්දමින් යොමු කරනු ඇතැයි සැමගේ විශ්වාසය බවට පත්ව තිබුණි.



අණදෙන නිලධාරී ලෙස වැඩ භාරගනිමින්

ඒකකයට අණදීම පටන්ගත් අණදෙන නිලධාරි විසින් ඒකකයේ සෙබළුන්ගේ සුබසාධන කටයුතු පිළිබඳව අවධානය යොමුකර තිබූ අතර, අඩුපාඩුකම් සම්පූර්ණ කරගැනීමට සියලු කටයුතු සංවිධානය කරන ලදී. මෙසේ සියලු කටයුතු සංවිධානය කර ගනිමින් සිටියදී හයවන ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත නව අණදෙන නිලධාරි වශයෙන් පත්ව ආ මේජර් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ සමඟින් එක්ව ප්‍රථම ක්‍රියාත්විතයට සූදානම් වූ අතර, ''කලු නරියා'' (Black Fox) නමින් 1993.01.30 වන දින වව්නියාව ප්‍රදේශයේ ආරම්භ කෙරුණු ක්‍රියාත්විතය ඉතා උසස් අන්දමින් සාර්ථක කරන්නට මෙම ඒකක හටපිරිස් වලට හැකියාව ලද බව සඳහන් කරමි. ජීවිත හා දේපල හානි අවම කරගනිමින් නිවැරදි අණදීම යටතේ සිදුකරන ලද මෙම ක්‍රියාත්විතය 1993.02.13 වන දින ඉතා සාර්ථක අන්දමින් නිමාවට පත්විය.

මේජර් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහගේ රාජකාරි කාලසීමාව තුළ ඒකකයේ පාලන කටයුතුවලට අමතරව ත්‍රස්තවාදීන්ගෙන් රට බේරාගැනීම සඳහා දියත් කළ ක්‍රියාත්විත විශාල ප්‍රමාණයකට අණදීම සිදු කරන ලදී. උතුරු ප්‍රදේශය ආරක්‍ෂා කරගැනීමේ අරමුණින් ත්‍රස්තවාදීන්ගේ ප්‍රවාහන හා පරිපාලන කේන්ද්‍රයේ මර්මස්ථානයක් බවට පත්ව තිබූ කිළාලි කළපුව හා ඒ අවට ප්‍රදේශය අත්පත් කරගෙන ත්‍රස්තවාදීන් විනාශ කිරීමේ සහ ඔවුන්ගේ පරිපාලන කටයුතු අඩාල කිරීමේ අරමුණින් 1993.09.28 වන දින පෙරවරුවේ ''යාල්දෙවි'' නමින් ක්‍රියාත්විතයක් ආරම්භ කරන ලද අතර, මෙම ඒකකයට නායකත්වය දුන් ඒකකයේ අණදෙන නිලධාරි තුමාගේ පූර්ණ අධීක්‍ෂණය යටතේ සහභාගි වූ නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ ජීවිත ආරක්‍ෂාව වෙනුවෙන් පිළිපැදිය යුතු බොහෝ කරුණු පැහැදිලි කරදෙමින් ඉදිරියේදී ක්‍රියාකළ යුතු අන්දම වෙනුවෙන් අවසන් ආධුනික සෙබළාගේ සිට සියලුම නිලයින් දක්වා දැනුවත් කරන්නට කටයුතු කරන ලදී. මේ අනුව නිවැරදි උපදෙස් හා නායකත්වය යටතේ ක්‍රියාකළ නිසාවෙන්ම 1993.10.04 වන දින යාල්දේවි ක්‍රියාත්විතයේ අවසානය සනිටුහන් වූ අතර, මෙම ක්‍රියාත්විතයේදී පාබල ඒකකයක් වශයෙන් අප ලද ජයග්‍රහණයන් මිස පරාජයන් හෝ අනිසි සිදුවීම් කිසිවක් නොවීම සමස්ත හමුදාව වෙනුවෙන්ම සතුටට පත්විය හැකි කරුණක් වන අතර, අණදෙන නිලධාරියෙකු ගේ නිවැරදි උපදෙස් හා ශක්තිමත් නායකත්වය නිසාවෙන්ම මෙම බළඇණිය නියමිත පරිදි හැඩ ගන්වා ගැනීමට හැකියාවක් ලැබීම අප සියලු දෙනා ලද ජයග්‍රහණයක් වශයෙන් සඳහන් කරන අතර, ඒකකයට අණදුන් මේජර් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ 1993.12.01 දින ලුතිනන් කර්නල් නිලයට උසස්වීම් ලැබීම ඒකකයට සුවිශේෂී අවස්ථාවක් ලෙස දැක්විය හැක.

යාපනය ඉඩෙයිකාඩු ප්‍රදේශයේ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මර්ධනය කර ප්‍රදේශයේ ආරක්‍ෂාව තහවුරු කිරීම සඳහා 1994.04.24 වන දින ''කික් ඔෆ්'' ක්‍රියාත්විතය ආරම්භ කරන ලද අතර, එම ක්‍රියාත්විතය තුළින් ඉඩෙයිකාඩු ප්‍රදේශයේ තැනින් තැන සැඟව සිටි ත්‍රස්තවාදීන්ට බරපතල හානි සිදු කරමින් ප්‍රදේශයේ ආරක්‍ෂාව තහවුරු කරන්නට හැකියාව ලද අතර, එම ක්‍රියාත්විතය ආරම්භයේ සිට අවසානය දක්වා ඒකක අණදෙන නිලධාරි ඉදිරි ප්‍රහාරක කණ්ඩායම් සමඟින් ඉදිරියට ගමන් ගනිමින් කටයුතු කරන ලද බව සඳහන් කළ හැකිය.

මේ අතරතුර අච්චුවේලි ප්‍රදේශයේ සැඟව සිට ප්‍රහාර එල්ල කරනු ලබන ත්‍රස්තවාදීන් පිළිබඳව ලද බුද්ධි තොරතුරු වලට අනුව එම ප්‍රදේශයේ ආරක්‍ෂාව තහවුරු කිරීම පිණිස 1994.07.21 දින ''හන්ටර්'' ක්‍රියාත්විතය ආරම්භ කරන ලද අතර, මෙම ක්‍රියාත්විතය තුළදී ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාර එල්ල වුවද, ඒකකයේ දැවැන්ත ප්‍රතිප්‍රහාර හමුවේ ත්‍රස්තවාදීන් පසුබැස යද්දී ප්‍රදේශයේ සම්පූර්ණ ආරක්‍ෂාව තහවුරු කරදීමට මෙමඒකක හටපිරිස් වලට හැකියාව ලැබිනි.

මාදගල් ප්‍රදේශයට ආවේණික වන පරිදි ආරක්‍ෂාව තහවුරු කරලීමේ අරමුණින් යුතුව ඒකක අණදෙන නිලධාරි ගේ මගපෙන්වීම යටතේ 1995.04.28 වන දින ''මේක් අප්'' ක්‍රියාත්විතය සිදු කරන ලද අතර, මෙම ක්‍රියාත්විතයේදී යුද හමුදාවට ආවේනික වූ බලාපොරොත්තු සඵල කරදෙමින්

පාබල ඒකකයක් වශයෙන් ඉතා සාර්ථකව අවසන් කරන්නට ඒකක භටපිරිස් වලට හැකියාව ලැබුණි.

කන්කසන්තුරේ නැගෙනහිරින් පිහිටි තොණ්ඩමනාරු ප්‍රදේශයේ ඉදිරි ආරක්‍ෂක වළල්ල පුළුල් කරගැනීමේ අරමුණින් 1995.05.17 සිට 1995.05.19 දින දක්වා ''මේක් පැසේජ්'' ක්‍රියාන්විතය ආරම්භ කරන ලද අතර, තොණ්ඩමනාරු කළපු තීරයෙන් ඔබ්බට ඇති සිවිල් ගම්මානයන්හි ආරක්‍ෂාව තහවුරු වන අන්දමින් ක්‍රියා කරමින් යුද්ධ හමුදාවේ ඉදිරි ආරක්‍ෂක කළාපය පුළුල් කරගැනීමට මෙමඟින් හැකියාව ලැබුණි. මෙම ක්‍රියාන්විතයේදී ද, ඉතා සාර්ථකව මෙහෙයුම් කටයුතු සිදු කරන ලද මෙම ඒකකයට අණදුන් ලුතිතන් කර්නල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ ඉමහත් මෙහෙවරක් ඉටු කරන ලද බව සඳහන් කළ හැකිය.

නැවත නැවතත් ත්‍රස්තවාදීන්ගේ මෝටාර් හා කාලතුවක්කු ප්‍රහාර එල්ලවීම තුළින් විටින් විට එල්ල කරන ලද ප්‍රහාරයන් නිසාවෙන් අච්චුවේලි ප්‍රදේශයේ ක්‍රියාන්විතයක් ආරම්භ කළ යුතුව ඇති බව පෙනී ගිය හෙයින් 1995.06.16 දින ''විදුලි පහර'' නමින් ක්‍රියාන්විතයක් ආරම්භ කරන ලද අතර, ක්‍රියාන්විතයේ නම විදුලි පහර නිසාවෙන් මෙන් අච්චුවේලි නගර සීමාව දක්වා ඉතා වේගවත් අන්දමින් ඇදුනු මෙම ඒකක භටපිරිස් එහිද නොනැනවතී ඉදිරි ප්‍රදේශයද නිරීක්‍ෂණය කරන ලදී. පසුව මෙම ක්‍රියාන්විතය සාර්ථක කරගන්නට නායකත්වය දුන් ඒකක අණදෙන නිලධාරීගේ උපදෙස් මත ක්‍රියාන්විතය අවසන් කරන ලදී.

අච්චුවේලි ප්‍රදේශයෙන් ගමන් ආරම්භ කළ 6 ශ්‍රීලපාහ ඒකකය ලුතිතන් කර්නල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ ගේ අණදීම යටතේ සියලු ත්‍රස්තවාදී බලමුළු විනාශ කරමින් යාපනය නගරය අත්පත් කරගැනීම දක්වා සාර්ථකව මෙහෙයවන ලදී. මෙහිදී මෙම අණදෙන තුමාගේ නායකත්වය එවකට යුද පෙරමුණේ සිටි සියලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පැසසුමට ලක්විය. මෙහිදී ඒකකයක් වශයෙන් දක්වන්නා වූ සුවිශේෂී කරුණක් වන්නේ ක්‍රියාන්විතය ආරම්භයේ සිට අවසානය දක්වා නිසි නියෝග ලබාදෙමින් සටන් පෙරමුණට ගොස් සෙබළුන් සමග නිරන්තරයෙන් රැඳී සිටීමයි.

ඉහත සඳහන් ක්‍රියාන්විත සඳහා ඒකක භටපිරිස් සහභාගි කරවමින් විශිෂ්ට නායකයෙකු මෙන්ම යුද සෙන්පතියෙකුගේ අභිමානවත් ක්‍රියාකිරීම මඟින් නැවත වරක් මාදගල් ප්‍රදේශයේ සිට ඉදිරියට ඇදෙමින් යාපනය නගර සීමාව අත්පත් කරගැනීමට ක්‍රියාන්විතයක් ආරම්භ කරන ලද අතර, ඒකකයට අයත්ව සිටි සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින් මේ සඳහා සහභාගි කරවාගෙන ක්‍රියාන්විතය සාර්ථක කරගැනීමට කටයුතු කරන ලදී. ඒකක භටපිරිස් සහභාගි කරවමින් නායකයෙකු මෙන්ම යුද සෙන්පතියෙකු මෙන් අභිමානවත් ලෙස ක්‍රියාකිරීම තුළින් මෙම ක්‍රියාන්විතයේ සාර්ථකත්වය ඉතා ඉහළ තලයක තිබූ අතර, මෙම සාර්ථකත්වය නිසාවෙන් ඉදිරි ක්‍රියාන්විත සැලසුම් සකස් කරන්නට පහසු වූයේ යාපනය ප්‍රදේශය පිළිබඳව සහ එම ප්‍රදේශයේ භූමිය පිළිබඳව යම් අවබෝධයක් ලබාගැනීමට හැකියාව ලැබීම මේ සඳහා මහගු පිටුවහලක් බවට පත්විය.

මෙම ඒකකය මාදගල් ප්‍රදේශයේ ස්ථානගතව සිටියදී සිදු කරන ලද යුද ක්‍රියාකාරකම් නිසාවෙන් යාපනය නගරය මුදවා ගැනීම සඳහා සහ ප්‍රදේශය පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබාගැනීම සඳහා 1995.07.09 දින දියත් කළ ''ඉදිරිපිම්ම'' නම් වූ ක්‍රියාන්විතයේදී ත්‍රස්තවාදීන් ඇටවූ පීඩන බෝම්බයකට ඒකක අණදෙන නිලධාරී ගමන්ගත් වාහනය හසුවීම හේතුවෙන් 1995.07.10 දින අණදෙන නිලධාරී තුවාල ලැබුව ද, යුද බිමෙන් පසුපසට නොගොස් ඒකක භටපිරිස් සමඟින්ම ඉදිරි සැලසුම් විධිමත් අන්දමින් සකස් කිරීම සහ ඒවා ක්‍රියාවට නැංවීම තුළින් මේ දේශයට දක්වන භක්තිය මොන තරම්ද යන්න පැහැදිලි නිදසුනක් විය.

1995.07.17 දින ඒකක භටපිරිස් යොදවා ගනිමින් ''හාර්ඩ් නොක්'' ක්‍රියාන්විතය සිදු කරන ලද අතර, මෙම ක්‍රියාන්විතයද, ඉතා සාර්ථක අන්දමින් අවසන් කරන්නට නිවැරදි නායකත්වය හා අණදීම තුළින් ඉස්මතු වූ සෙබළ ශක්තියෙන් හැකි වූ බව සඳහන් කළ හැක.

අලවෙඩ්ඩි ප්‍රදේශයේ නැවත වරක් ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාකාරකම් වර්ධනයවීම හේතුවෙන් ක්‍රියාන්විතයක් සිදු කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු වූ බැවින් 1995.08.04 දින ''විදුලි පහර II'' ක්‍රියාන්විතය සැලසුම් කර ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන ලද අතර, නැවත වරක් මෙම ප්‍රදේශයේ සැඟව සිටි ත්‍රස්තවාදී සාමාජිකයින් විනාශ කර ත්‍රස්තවාදී භීතිකාව ඉවත්කර දමන්නට නායකත්වයේ වගකීම ගෙන ක්‍රියාකරන ලද බව නැවත වරක් පැහැදිලි කර ඇත.

මාදගල් ප්‍රදේශයේ තිබූ ඉදිරි ආරක්‍ෂක වළල්ල පුළුල් කරගැනීමේ අරමුණින් 1995.08.07 වන දින සිට 1995.08.15 දින දක්වා ''ෂේක් හෑන්ඩ්'' ක්‍රියාන්විතය සිදු කරන ලද අතර,



ඉදිරිපිම්ම ක්‍රියාන්විතයේ ලද විරාමයක්




යුද බිමේදී ඉදිරි ක්‍රියාන්විත පිළිබඳ දැනුවත් කරමින්

මෙම ක්‍රියාන්විතය සඳහා ඒකක අණදෙන නිලධාරි ගේ අණදීම යටතේ ඒකකයට අයත් සියලුම භටපිරිස් සහභාගි විය. මෙම ක්‍රියාන්විතයේදී ඒකක භටපිරිස් දැක්වූ දස්කම් නිසාවෙන් ඒකක අණදෙන නිලධාරී ඇතුලු සියලු නිලයින් උසස් මූලස්ථානයන්හි පැසසුමට ලක්වූ අතර, එම දක්‍ෂතා නිසා ඉදිරි ආරක්‍ෂක කළාපය පුළුල් කර ප්‍රදේශයේ ආරක්‍ෂාව විධිමත් කරලීමට හැකියාව ලැබින.

පන්ඩතිරිප්පු ප්‍රදේශයේ ආරක්‍ෂාව තහවුරු කරගැනීම සඳහා 28 බසේමු යටතේ "ඩ්‍රැගන් ෆයර්" ක්‍රියාන්විතය සිදු කරන ලද අතර, මෙම ක්‍රියාන්විතය සඳහා ඒකකයට අයත් 'ඒ සහ 'බී' කණ්ඩායම් දෙක ඒකක අණදෙන නිලධාරිගේ අණදීම යටතේ සහභාගි විය. මෙහිදි 28 බසේමු හි උපදෙස් පරිදි සිදු කරන ලද මෙම ක්‍රියාන්විතය සාර්ථක කරන්නට අවශ්‍ය මෙහෙයුම් සැලසුම් කරමින් අවසන් කරන්නට හැකියාව ලැබින.

කඩ්ඩුවාන් ප්‍රදේශය තුළ විටින් විට සිදු වූ ත්‍රස්තවාදි ක්‍රියාකාරකම් මර්ධනය කර සාමකාමී ප්‍රදේශයක් බවට පත්කිරීමේ අදහසින් "බැරල් වෝර්මර්" ක්‍රියාන්විතය 9 වන බළසේනා මූලස්ථානයේ අණසක යටතේ සිදු කරන ලද අතර, මෙම ක්‍රියාන්විතය සඳහාද ඒකක අණදෙන නිලධාරි ගේ අණදීම යටතේ 'සී' සහ 'ඩී' කණ්ඩායම් භටපිරිස් සහභාගි කරවා ඇත. මෙහිදී ඒකකයට අයත් නිලධාරීන් දෙදෙනෙකු සහ එක් සෙසුනිලයෙකු තුවාල ලබා ඇති අතර, ඒ හැරුණුකොට අන් සියලු කටයුතු ක්‍රියාන්විතයේ සාර්ථකත්වය දක්වාම යහපත් අන්දමින් සිදු විය.

1995.09.12 වන දින සිට 1995.09.19 දින දක්වා දක්වා අලවෙඩ්ඩි ප්‍රදේශයේ පවතින ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් විනාශ කිරීම සදහා "ෂේක් හැන්ඩ්" ක්‍රියාන්විතය ආරම්භ කරන ලද අතර, ඒකක භටපිරිස් වෙත නිවැරදි උපදෙස් හා කරුණු වටහා දෙමින් ඒකක අණදෙන නිලධාරි ක්‍රියාන්විතයේ ජය මාවත දක්වාම සියලු භටපිරිස් යොමු කරලීම පිළිබද කරුණු ඒකක ඉතිහාසය තුලද ලියවී ඇත.

532 වන බළසේනා මූලස්ථානයේ අධීක්‍ෂණය යටතේ 1995.10.01 වන දින සිට 1995.10.10 වන දින දක්වා මාදගල් ප්‍රදේශයෙන් ඉදිරියේ "තන්ඩර් ස්ට්‍රයික්" ක්‍රියාන්විතය සිදු කරන ලද අතර, මෙම ක්‍රියාන්විතය සඳහා පාබල ඒකකයක් වශයෙන් මෙම ඒකකයට අයත් සියලුම භටපිරිස් සහභාගි වී



රිවිරැස ක්‍රියාන්විතයේදී

ඇත. ප්‍රදේශයේ ආරක්ෂක කටයුතු කරගැනීම සහ ඉදිරියේදී සිදු කිරීමට නියමිත ක්‍රියාන්විත සඳහා තොරතුරු එක්රැස් කරගැනීමේ අදහසින් මෙම ක්‍රියාන්විතය සිදුකර ඇති අතර, මෙහිදීද ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ ගේ අණදීම යටතේ සියලු ජයග්‍රහණ ලබාගෙන ඇති බව සඳහන් කරමි.

උතුරු යාපා පටුන ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයෙන් මුදවා ගැනීම පදනම් කරගනිමින් 1995.10.21 වන දින අලුයම 0530 පැයට අච්චුවේලි ප්‍රදේශයෙන් ආරම්භ කරන්නට යෙදුනු ''රිවිරැස'' ක්‍රියාන්විතයේ පෙරමුණ ගත් පාබල ඒකකයන් අතර ඉදිරියෙන්ම සිටි බළඇණියක් වන්නට 6 වන ශ්‍රී ලංකා පාබල හමුදාව ක්‍රියාකාරී වූයේ ඒකකයේ ගමන් මග මෙන්ම පරිපාලන කටයුතු විධිමත් අන්දමින් සිදු කරන නායකයෙකුගේ නායකත්වය නිසාවෙන් බව සෑම සියලු දෙනාගේම කතා බහට ලක්වූ කරුණක් බවට පත්ව තිබූ නිසාවෙනි. මෙම ක්‍රියාන්විතය සමඟින් දිනෙන් දින ඉදිරියට ගමන් ගැනීමේදී එල්ල වූ විවිධ බාධක ජය ගැනීමට නිරන්තරයෙන්ම උත්සාහ දරණ ලද ඒකකයක් බව සදහන් කළ හැකි වේ. එම උත්සාහයන් නිසාවෙන්ම මෙම ක්‍රියාන්විතයේ ගමන් මග සාර්ථක කරගනිමින් ඉදිරියටම ඇදෙන්නට අවස්ථාව සහ ඉඩකඩ සලසා ගත් ඒකක භටපිරිස් වෙත නිරන්තරයෙන්ම නායකත්වයේ උපදෙස් ලද බව සඳහන් කරන අතර, එදා යාපනය දෙසට යුද හමුදා භටපිරිස් ක්‍රමක් ක්‍රමයෙන් ළඟා වන බව දැන ගැනීමෙන් කොටි ත්‍රස්තවාදීන් හා ඔවුන්ගේ නායකයින් අවුල් වියවුල් වී



ඇති බව බුද්ධි අංශ වෙතින් ලබාගන්නා ලද තොරතුරු වලින් දැන ගන්නට හැකියාව ලැබී ඇත. සෑම උත්සාහයක්ම දරා ගනිමින් ත්‍රස්තවාදීන්ගේ සැපයුම් මාර්ග අඩපන කරන්නට කටයුතු කිරීම හා එම ප්‍රදේශ වලින් ඔවුන් විනාශකර දැමීම මෙම ක්‍රියාන්විතයේ ප්‍රධාන අරමුණ වී තිබූ අතර, ඒ නිසාම ක්‍රියාන්විතයේ ඉදිරි ගමන් මග සාර්ථක කරගැනීමට හැකියාව ලැබී ඇත.

එදා යාපනය නගරයට යුද හමුදාව ඇතුලු වුවහොත් යාපනය නගරයම එකවර විනාශවී යන අන්දමට පුපුරුවා හරින්නට මර උගුල් සහ බිම් බෝම්බ අටවා ඇති බවත්, ජීවිත වලට ඇල්මක් ආදරයක් ඇත්නම් නගරසීමාවට ඇතුලු නොවන ලෙසත්, ත්‍රස්තවාදීන් විසින් නිකුත් කරන ලද නියෝග මඟින් මෙන්ම මුද්‍රිත පත්‍රිකා මගින් දැනගන්නට හැකියාව ලැබිණි. එනමුත් එම පෙර දෙඩුම් කිසිවක් වෙත යොමු නොවූ ආරක්ෂක හමුදා භටපිරිස් තම රටටත්, ජාතියටත් ඇති ආදරය භක්තිය නිසාවෙන් සියලු බලවේග ඉවත දමන්නටත්, ඒකීය රාජ්‍යයක පිළිවෙත විදහා දක්වන්නටත් ක්‍රියාකර ඇත. ත්‍රස්තවාදි සන්නද්ධ සාමාජිකයින් සොයා ගොස් ප්‍රහාර එල්ල කර විනාශ කිරීමේ හැකියාවන් වලින් පරිපූර්ණ වෙමින් නිවැරදි මගක් වෙත යොමු කරන්නට ද මෙම අණදෙන නිලධාරී උත්සහා ගන්නා ලදී.

ක්‍රීඩා මෙන්ම පාලන අංශයන්හි ද දියුණුව සහ වර්ධනය ඇති කරලිමේ අදහසින් ක්‍රියාකළ කාලපරිච්ඡේදයක්



බවට එම කාලසීමාව සඳහන් කරන්නට හැකියාව ඇත. එසේම එවකට යාපනය ප්‍රදේශයේ සියලු පහසුකම් වලින් සමන්විත වූ ඒකකයක් බවට පත් කිරීමට මෙම අණදෙන නිලධාරී කටයුතු කරන ලද අතර, මෙමඟින් ඒකකයට අයත් සියලුම නිලධාරී/සෙසුනිලයින්ගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හැකි වූවා සේම යාපනය අර්ධද්වීපයේ අවම පහසුකම් මධ්‍යයේ රාජකාරි කරන ලද වෙනත් ඒකකයන්හි අයවලුන්ටද මනා පිටුවහලක් වූ බව සඳහන් කළ හැකි වේ.

එපමණක්ද නොව අහිංසක සිවිල් වැසියන්ගේ මූලික පහසුකම් නංවාලීම වෙනුවෙන් හා ඔවුන්ගේ මානුෂීය නිදහස වෙනුවෙන් නිතර සොයා බලමින් ක්‍රියා කරන ලද මෙම අණදෙන නිලධාරී ඒකකයට අයත් සියලුම නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ සුබසාධක කටයුතු මෙන්ම අනෙකුත් අවශ්‍යතාවයන් කෙරෙහි සොයා බලමින් ක්‍රියාකරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීවරයෙකු වශයෙන් හඳුන්වා දීමේ හැකියාවද ඇත.

එසේම හයවන ශ්‍රී ලංකා පාබල බළඇණියේ අණදෙන නිලධාරී වශයෙන් රාජකාරි කළ කාළසීමාව තුළ මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී ඒකකයටත්, ඒකකයේ රාජකාරී කරන ලද සියලු නිලධාරීන්ටත්, සෙසුනිලයින්ටත්, නිරන්තරයෙන්ම ආදරය කරුණාව දැක්වූ අතර, ඔවුන්ගේ යහපත වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක් කරන ලදී. තම අණසක යටතේ ක්‍රියාත්මක වූ මෙම ඒකකය වෙනුවෙන් සිදු නොකළ වැඩ කොටසක් නොමැති බව සඳහන් කරනු ලබන අතර, එම ක්‍රියාවලිය යටතේ මාදගල් සහ කන්කසන්තුරේ යන ස්ථාන වල ''තල්සෙවන'' නමින් නිලධාරීන්ට හා සෙසුනිලයින්ට එකාකාරී බවෙන් මිදීමට නිවාඩු නිකේතනයක් මුලින් 1994.05.01 දින මාදගල් ප්‍රදේශයේ ද, දෙවැන්න 1994.12.01 දින කන්කසන්තුරය ප්‍රදේශයේ ද, මෙතුමාගේ සංකල්පයකට අනුව ඉදිකර යුද හමුදා සාමාජිකයින්ගේ පරිහරණය සඳහා ලබාදීමෙන් පසු දැනටත් තල්සෙවන නිවාඩු නිකේතනය කන්කසන්තුරය ප්‍රදේශයේ පවතියි. මෙම මාදගල් තල්සෙවන ශ්‍රී ලංකා පාබල හමුදාව





නියෝජනය කරමින් සටන් පෙරමුණට ගොස් සිටි ලුතිතන් වාස්ගුණවර්ධන ශ්‍රීලපාහ ඇතුලු රණවිරුවන් දහතුන් දෙනෙකු ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරයකට හසුව ජීවිතක්ෂයට පත්වීම සිහිග ැන්වෙන පරිදි ඉදි වූවක් බව සනිටුහන් කරනු ලබන අතර, එම මාරාන්තික අවස්ථාවෙන් දිවි ගලවාගත් බනි I ආර්ජ්යූ පෙරේරා එම ස්ථානයට කැඳවා කෘතගුණ දැක්වීමට එවකට මෙම අණදෙන නිලධාරී ක්‍රියා කිරීම සුවිශේෂී කරුණක් වේ.

පෙර රාජකාරි තත්ත්වය තව තවත් වර්ධනය කර ගනිමින් නිසි දායකත්වයක් මෙන්ම නිවැරදි නායකත්වයක් දුන් මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී තම අණදීමේ කාලය අවසන් කර 1996.01.27 දින ඒකකයෙන් සමුගෙන ගියද අණදුන් ඒකකය වෙනුවෙන් මෙන්ම තමාට ශක්තියක් වූ ඒකකයේ සියලුම නිලයින්ට නිරන්තරයෙන්ම ඇලුම් කළ මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී ඉඩ ලැබෙන සෑම අවස්ථාවකදීම ඒකකය පිළිබඳවත්, ඒකකය සමඟින් රාජකාරී කරනු ලබන භටපිරිස් පිළිබඳවත් සොයා බලා කටයුතු කිරීම පැසසුමට ලක්කළ යුතු කරුණක් බව සඳහන් කළ හැකිය. එපමනක් ද නොව ඒකකය මඟින් සිදු කරනු ලබන සියලුම පොදු වැඩ කටයුතු පිළිබඳව නිරන්තරයෙන්ම සොයා බලා කටයුතු කරන ලද අතර, 2011.06.02 වන දින ඒකක භටපිරිස් හි නව ස්ථානගතවීම බවට මිහින්තලේ මහකනදරාව කඳවුර පත් වෙද්දී එතැන් සිට ඒකකය මඟින් සිදු කරන්නට සැලසුම් කළ සෑම ඉදිකිරීම් කටයුත්තක් කෙරෙහිම සොයා බලා නිවැරදි පිළිවෙත් අනුව සිදු කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම අප කාගෙත් සතුටට කරුණකි. ඒ අනුව ඒකකය ස්ථානගත මිහින්තලේ කඳවුරට තදින්ම බලපා තිබූ ගැටළුවක් වූ පානීය ජලය ලබාගැනීමට ඇවැසි ඉදිරි කටයුතු සිදු කරදීම අමතක නොකළයුතු කරුණකි. මෙතුමාගේ සංකල්පයකට අනුව ඓතිහාසික විජිතපුර සටන පිළිබිඹු වන ප්‍රධාන දොරටුව ඉදි කිරීම මේ වන විට නිමකර ඇති අතර, එය ලංකාවේ විජිතපුර සටන පිළිබිඹු වන ආකාරයට නිමවූ එකම නිර්මානය බවට ලක් ඉතිහාය තුළ මේ වන විටත් මූලාශ්‍රයක් එක්කර ඇත.

නිදහස් නිවහල් දේශයක් නිර්මාණය කරන්නට 80 දශකයේ සිට 2009 වර්ෂයේ මැද භාගය දක්වා වූ කාළසීමාව තුළ නිරන්තරයෙන්ම යුද ක්‍රියාකාරකම් වල නියැලෙමින් යුද්ධ හමුදාවේ විවිධ වූ උසස් තනතුරු දරමින් විශිෂ්ට මෙහෙවරක් ඉටු කරන ලද ඒකකයට අණදී කීර්තිමත් සේවයක් ඉටු කළ අණදෙන නිලධාරී තුමණි, ඔබ තුමන් දැක්වූ මෙහෙවර තුළින් හා ත්‍රස්තවාදය පිටුදැකීමේ ගමන් මඟට නායකයෙකු මෙන්ම යුද විශ්ලේෂකයෙකු වශයෙන් සකස් කරන ලද සැලසුම් ක්‍රියාත්මක කිරීමට හැකිවීම තුළින් අද දවස තුළ ලංකාවේ සෑම පුරවැසියෙකුටම හෙටත් දවසක් ඇති බව කියන්නට හැකි අන්දමින් නිදහසේ ජීවත්වීමේ අවස්ථාව උදාකරදී ඇත. එවන් වූ දක්ෂතාවයන් තුළින් සැකසුන ඔබ තුමන්ගේ ගමන් මඟ අද දවස වන විට



යුද්ධ හමුදාවේ ගෞරවාන්විත ස්ථානය දක්වා පිවිසෙන්නට අවස්ථාව සැලසී ඇති බව අප සිහිපත් කරන්නෙමු. එවන්වූ බැඳීරුම් සේවාවක් ඉටුකරමින් සිටියදී ශ්‍රී ලංකාවේ විසිවන යුද්ධ හමුදාධිපති වශයෙන් හා ශ්‍රී ලංකා පාබල හමුදාවෙන් බිහිවූ හයවන හමුදාධිපති වශයෙන් පත්වීම් ලැබීම අප ලද විශිෂ්ට වූ ජයග්‍රහණයක් සේ සලකන අතරම, ඒ වෙනුවෙන් මෙම ඒකකයේ උණුසුම් සුබ ප්‍රාර්ථනාවන්ද මෙමඟින් එක් කරන බව සඳහන් කරන්නෙමු.



මෙවන් වූ නායක සෙන්පතියෙකු යටතේ සේවය කරන්නට ලද අවස්ථාව නියත වශයෙන්ම අප ලැබූ සුවිශේෂී අවස්ථාවකි.

ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී යුද්ධ හමුදාධිපති තුමණි, ඔබ තුමන්ටත්, ඔබ තුමන්ගේ පවුලේ සියලු දෙනාටත් ශ්‍රී දළඳා සමිඳුන්ගේ පිහිට ආරක්ෂාව ලැබී යුද්ධ හමුදාවේ අභිවෘද්ධියට එළදායි සේවාවක් ඉටුකිරීමට හැකිවන පරිදි සුබ අනාගතයක් සැලසේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.

6 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ
අණදෙන නිලධාරී
ඇතුලු සියලු නිලයින්

# රණබිමේ දී ...

කපිතාන් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ මොනතරම් කාර්ය බහුල වුවත් විදුහලෙන් ක්‍රීඩාවට දක් වූ දක්ෂතා අමතක කළේ නැත. ඉඩ ලද විගස ක්‍රීඩාවට යොමු වී මලල ක්‍රීඩකයෙකු මෙන්ම රගර් ක්‍රීඩකයෙකු වශයෙන් කීර්තියක් ගෙන දී ඇත. අන්තර් ඒකක සටන් පුහුණු වෙඩි තැබීමේ තරගාවලිය සඳහාද සහභාගි වී ඇත.



බලවේගය මෙහෙයුමේදී ...

ගුරුනගර්, අලිමංකඩ, පූනරින්, මාන්කුළම, පලාලි, කිලිනොච්චිය වැනි ප්‍රදේශවල රාජකාරී කිරීමෙන් යුද හමුදාවේ ව්‍යාප්තියත් සමඟ 4 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත 1987 මැයි මස 05 වන දින මන්ක්‍රිබ්බ් කඳවුර වෙත රපෝර්තු කරන ලදී. 4 ශ්‍රීලපාහ ඒකකයේ 'ඒ' කණ්ඩායම් නිලධාරී අණදෙන ලෙසින් රාජකාරී භාර ගැනීමෙන් පසු ඓතිහාසික වඩමාරච්චි මෙහෙයුමට දායක වී පේදුරුතුඩුව ප්‍රදේශයේ ආරක්ෂාව තහවුරු කරන ලදී.

තවද, ඉන්දීය සාමසාධක හමුදා ලංකාවේ රාජකාරී සිදු කිරීමට පැමිණීමේදී දකුණු පළාතේ ඇති වූ රාජ්‍ය විරෝධි ක්‍රියා තුළින් ඇති වූ ප්‍රචණ්ඩකාරීන් මර්ධනය කිරීම සඳහා කෙලිප්පිටිල, අනුරැක්ක, වැලිගම ප්‍රදේශයන් හි ආරක්ෂාව තර කිරීමට කටයුතු සිදු කළේය.



නිලධාරී අණදෙන ඒ කණ්ඩායම 4 ශ්‍රීලපාහ

නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය ප්‍රදේශයේ කොටි ත්‍රස්තවාදීන් විසින් නතු කරගෙන සිටි ත්‍රිකුණාමලය නගරය, උප්පුවේලි, නිලාවේලි හා සාම්බල්තිව් ප්‍රදේශ මුදා ගැනීමට දයාකත්වය ලබාදුන් කපිතාන් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ ඉන් අනතුරුව ජයපුර, පාලාම්පටාර්, සුමේධගම, මූතූර්, අභයපුර, මිහිදුපුර, ආනන්දකුළම් හා කොඩ්බේ යන ප්‍රදේශයන් වල ආරක්ෂාව තහවුරු කිරීමට 4 ශ්‍රීලපාහ ඒකකය සමඟින් කටයුතු සිදු කර ඇත.

1990 අගෝස්තු මස 15 වන දින කෝවිල්අඩි ප්‍රදේශයේ සීමිත ක්‍රියාන්විතයක් සිදු කර ඉන්පසු මුලතිව් නගරය මුදවා ගැනීම වෙනුවෙන් සිදු කළ " මුහුදු මද සුළං" ක්‍රියාන්විතයට ද, සහභාගි විය.

1991 අප්‍රේල් මස 25 වන දින සිට 1992 ජනවාරි මස 15 වන දින දක්වා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ විධායක අධිකාරී වශයෙන් මේජර් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ රාජකාරී කරමින් රෙජිමේන්තුව තුළ මහඟු සේවයක් ඉටු කරන ලදී. ඉන් අනතුරුව 1992 වසරේ බුද්ධි බළකාය ආරම්භ කිරීමේදී එම බළකායට මේජර් නිලයේ පස්දෙනෙකු තෝරාගෙන ඇත. එම පස් දෙනාගෙන් එක් නිලධාරියෙකු වශයෙන් මේජර් දයා රත්නායක තෝරාගෙන ඇත. මෙම බළකායේ ප්‍රථම නිර්මාණ කිරීමේ නිර්මාතෘ වන්නේද මෙම නිලධාරියාය.




යාල්දේවි මෙහෙයුමේදී...

# රිවිරැස මෙහෙයුමේදී ...



6 ශ්‍රීලපාහ ඒකකයේ නියමුවානත් වශයෙන් 1993.01.28 දින 0638 පැයට යෙදී තිබූ සුබ මොහොතෙන් මේජර් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ අණදෙන නිලධාරි තනතුරේ රාජකාරීන් භාර ගන්නා ලදී. මේජර් දයා රත්නායක ඒකකයට පැමිණීමට පෙර ප්‍රගුණකර තිබූ සුවිශේෂී වූ අත්දැකීම් ද උපයෝගී කරගනිමින් ප්‍රථම ක්‍රියාන්විතය වූ " කලු නරියා" (බ්ලැක් ෆොක්ස්) 1993.01.30 වන දින වව්නියාව ප්‍රදේශයෙන් ආරම්භ කිරීම ද, "වන්නි වික්‍රම II " ක්‍රියාන්විතයට ඒකක භටපිරිස් හසුරවමින් නායකත්වය ලබාදීම ද සිදු කළේය. "වන්නි වික්‍රම II "ක්‍රියාන්විතයේ සුවිශේෂත්වය වනුයේ යුනිකෝන් බගල් රථ උපයෝගි කර ගත් ක්‍රියාන්විතයක් ලෙස ඉතිහාස ගතවීමයි. නිවැරදි අණදීම යටතේ සිදුකරන ලද මෙම ක්‍රියාන්විතය 1993.02.13 වන නිමාවට පත්විය. උතුරු ප්‍රදේශය කිලාලි කළපුව හා ඒ අවට ප්‍රදේශය අත්පත් කරගෙන ත්‍රස්තවාදීන් විනාශ කිරීමේ සහ ඔවුන්ගේ පරිපාලන කටයුතු අඩාල කිරීමේ අරමුණින් 1993.09.28 වන දින ආරම්භ කළ "යාල්දේවි" ක්‍රියාන්විතය අයියකච්චි ඉදිරි ආරක්‍ෂක වළල්ලෙන් ආරම්භ කළේය. 6 ශ්‍රීලපාහ ඒකකයේ භටපිරිස් හට උපදෙස් හා



නියෝග ලබාදෙමින් ක්‍රියාන්විතයේ සිදු කළ යුතු කාර්යයන් සිදු කරන ලදී. ඉන්පසු පැති ආවරණය ලබාදී ක්‍රියාන්විතය අවසන් කර නැවත අයියකච්චි කඳවුර වෙත පැමිණීමේදී ක්‍රියාන්විතයට සහභාගි වූ එක් ඒකකයක් ත්‍රස්තවාදීන්ගේ දරුණු ප්‍රහාරයකට ලක් විය. ක්ෂණිකව ක්‍රියාත්මක වූ මේජර් දයා රත්නායක තම එක් කණ්ඩායමකට දුන් අණ අනුව එම දරුණු ත්‍රස්ත ප්‍රහාරය මැඩ පවත්තවා ප්‍රහාරයට ලක් වූ බළඇණිය බේරා ගන්නා ලදී. මෙම විශ්මිත ප්‍රහාරය පිළිබඳ යාල්දේවි ක්‍රියාන්විතයට සහභාගී වූ භටපිරිස් අතර බොහෝ කලක් කතාබහට ලක් විය.

වර්ෂ 1993 දෙසැම්බර් මස පළමු දින ඊළඟ නිලයට උසස්වීම ලැබූ ලුතිතන් කර්නල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ශ්‍රීලපාහ 6 ශ්‍රීලපාහ ඒකකයට තවත් අභිමානයක් විය.

යාපනය ඉඩෙයිකාඩු ප්‍රදේශයේ 1994.04.24 වන දින ''කික් ඕෆ්'' ක්‍රියාන්විතය, 1994.07.21 දින ''හන්ටර්'' ක්‍රියාන්විතය, මාදගල් ප්‍රදේශයට ආරක්‍ෂාව තහවුරු කරලීමේ අරමුණින් 1995.04.28 වන දින ''මේක් අප්'' ක්‍රියාන්විතය, කන්කසන්තුරේට නැගෙනහිරින් පිහිටි තොණ්ඩමනාරු ප්‍රදේශයේ ඉදිරි ආරක්‍ෂක වළල්ල පුළුල් කරගැනීමේ අරමුණින් 1995.05.17 සිට 1995.05.19 දින දක්වා ''චෙක් පැසේජ්'' ක්‍රියාන්විතය, අච්චුවේලි ප්‍රදේශයේ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් අඩපන කිරීමේ අරමුණින් 1995.06.16 දින ''විදුලි පහර'' ක්‍රියාන්විතය, 1995.07.09 දින දියත් කළ ''ඉදිරිපිම්ම'' ක්‍රියාන්විතය 1995.07.17 දින ''හාඩ් නොක්'' ක්‍රියාන්විතය, අලවෙඩ්ඩි ප්‍රදේශයේ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මර්ධනය කිරීම සඳහා 1995.08.04 දින '' විදුලි පහර II'' ක්‍රියාන්විතය, මාදගල් ප්‍රදේශයේ ඉදිරි ආරක්‍ෂක වළල්ල පුළුල් කිරීමේ අරමුණින් 1995.08.07 වන දින සිට 1995.08.15 දින දක්වා ''ෂේක් හැන්ඩ්'' ක්‍රියාන්විතය, පන්ඩතිරිප්පු ප්‍රදේශයේ ආරක්‍ෂාව තහවුරු කරගැනීම සඳහා ''ඩ්‍රැගන් ෆයර් '' ක්‍රියාන්විතය, කඩ්ඩුවාන් ප්‍රදේශයට එල්ල වන ත්‍රස්තවාදී ප්‍රහාර මර්ධනය කිරීමේ අරමුණින් ''බැරල් වෙර්මර්'' ක්‍රියාන්විතය, 1995.09.12 දින සිට 1995.09.19 දින දක්වා දක්වා අලවෙඩ්ඩි ප්‍රදේශයේ ආරක්‍ෂාව තහවුරු කිරීම වස් ''ෂේක් හැන්ඩ් II'' ක්‍රියාන්විතය, 1995.10.01 දින සිට 1995.10.10 දින දක්වා මාදගල් ඉදිරි ආරක්‍ෂක වළල්ලෙන් ඉදිරියේ '' තන්ඩර් ස්ට්‍රයික් '' ක්‍රියාන්විතය සහ යාපනය නගරය මුදවා ගැනීම සඳහා 1995.10.21 දින ආරම්භ කළ '' රිවිරැස '' යන ක්‍රියාන්විතයන් වලට සහබාගි වූ 6 ශ්‍රීලපාහ ඒකකයට අණදෙන නිලධාරි ලෙසින් විශිෂ්ට නායකත්වයක් ලබා දී ඇත.

එපමණක් නොව ''ඉදිරි පිම්ම '' ක්‍රියාන්විතයේදී 1995.07.10 දින ත්‍රස්තවාදීන් ඇටවූ පීඩන බෝම්බයකට ලුතිතන් කර්නල් දයා රත්නායක ගමන් ගත් වාහනය හසුවිය. එහිදී තුවාල ලැබුවද යුද බිමෙන් පසුපසට නොගොස් ඒකක භටපිරිස් සමඟින්ම සිට ඔවුන් දිරිමත් කළ මේ නායකයා ශ්‍රී ලංකාද්වීපය වෙනුවෙන් තම වගකීම් ඉටු කළේය.

එමෙන්ම 6 ශ්‍රීලපාහ ඒකකයේ අණදීම සිදු කරන අතරතුර නිලධාරීන්ගේ සෙසුනිලයින්ගේ සුබසාධනය වෙනුවෙන් මාදගල් සහ කන්කසන්තුර ප්‍රදේශයන් හී '' තල් සෙවන '' නමින් නිවාඩු නිකේතනයන් ස්ථාපනය කරන ලදී. අද එම නිවාඩු නිකේතනය දෙස් විදෙස්වල පවා ප්‍රචලිතය.

1993 ජනවාරි මස 28 වන දින සිට 1996 ජනවාරි මස 27 දින දක්වා පුරා වසර තුනක ඒකකයේ අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි සිදු කර ඒකකයෙන් නික්ම ඉන් ලද පන්නරය සමඟින් ශ්‍රී ලංකා යුද හමුදාවට නායකයින් බිහිකරන විද්‍යා පීඨය වන දියතලාව යුද හමුදා විද්‍යා පීඨයේ අණදෙන නිලධාරි ලෙසින් 1996 වසරේ සිට 1998 වසර දක්වා රාජකාරි සිදු කරන ලදී.

ශ්‍රී දළඳා සමිඳුන් වහන්සේ වැඩ වසන මහනුවර ප්‍රදේශ මූලස්ථානයේ ආඥාපති ලෙසින් රාජකාරි කරන අවධියේ එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගෙ ම්ලේඡ්ච ප්‍රහාරයෙන් දළඳා සමිඳුන් වැඩ සිටි මාළිගාවට හානි සිදු විය. කැඩී බිඳී ගිය මාළිගාවේ වහල පැති බැම්ම ඇතුලු සියලු ස්ථාන මාළිගාවේ දියවඩන නිලමේගේ සහයෝගයෙන් සහ ලබාදුන් උපදෙස් අනුව වැඩ කණ්ඩායම් යොදවා අලුත් වැඩියා කටයුතු කඩිනමින් සිදු



අතිගරු ජනාධිපතිතුමියගේ සුරතින් වීර පදක්කමක් ලබා ගනිමින් ...

# Message from the former Light Infanrty Commander of the Army

## General (Retd) SHS Kottegoda WWV RWP RSP VSV USP ndc



It is with much pleasure that I send this message to the "Special White Hackle" edition published to felicitate the new Commander of the Sri Lanka Army, Lt. General R.M.D. Ratnayake, WWV, RWP, RSP, USP, ndu, psc, who became the 6th CLI officer to reach the highest position in the Army. A proud product of Maliyadeva College, Kurunegala, Lt. Gen. Daya Ratnayake has done proud to his alma mater by becoming the first ever Commander of the Army from his College. He assumed office on 1st August 2013 as the 20th Commander of the Sri Lanka Army.

I came to know Daya from the time he joined our proud Regiment, the Sri Lanka Light Infantry as a Second Lieutenant. At that time I was the Officer Commanding 'A' Company of I SLLI and deployed in Velvettithurai. It is somewhat a difficult task for me to project the many highlights of his illustrious career of over 33 years, but I recall that, as a young officer he proved to be a fine officer with much enthusiasm to learn and possessed a good sense of responsibility and commitment to duty. Later, he turned out to be a disciplined and a professionally competent officer who was an example to others.

Wherever and whatever capacity he worked, he had uppermost in his mind, the interest of the institution he served, in general, and his fellow officers and subordinates in particular. His uprightness won him the admiration of his superiors, peers and subordinates alike. His contribution to upkeep the traditions of our proud Regiment was immense. During my tenure as the Colonel of the Regiment, Daya functioned as the Centre Commandant. He carried out his responsibilities in conscientious and exemplary manner and exhibited a high sense of dedication and loyalty to the Regiment. I have no doubt that he will continue to fulfil his obligations to the Regiment in his capacity as the Commander of the Army.


A sportsman of repute, he excelled in athletics and rugby representing the Army. He has also been a successful sports administrator.

During his illustrious career, Lt. Gen. Daya Ratnayake has served in nearly all parts of the island for the preservation of the territorial integrity and sovereignty of our motherland. He is the proud recipient of many decorations and gallantry medals. I am certain his vast experience will stand in good stead to carry out the challenging responsibilities in his new appointment.

Finally, as a member of the SLLI family, I am personally proud and happy to see another officer from the Regiment at the helm to steer our Army to greater heights. I have no doubt that Lt. Gen. Ratnayake will discharge his responsibilities in a manner to bring honour to our country and to the Army. I wish him success in all his future endeavours.

General (Retd)
SHS Kottegoda WWV RWP RSP VSV usp ndc
Ambassador of Sri Lanka to Thailand

# සුබ මොහොතින් රෙජිමේන්තු සේනාවිධායක ලෙස නව පත්වීම ලබා ....



කරන ලදී. මෙම කැපවීම අස්ගිරි මල්වතු මහා පාර්ශවයන් හී මහා නායක හිමිපානන් පමණක් නොව දියවඩන නිලමේ, නගරාධිපති ඇතුලු ප්‍රභූවරුන් ගේ මහත් ප්‍රශංසාවට පත් වන ලදී.

ඉන් අනතුරුව 533 බළසේනාධිපති මෙන්ම 534 බළසේනාධිපති ලෙසින් ඒකකයන් වෙත ඇවසි උපදෙස් නියෝග හා නායකත්වය නොඅඩුව ලබාදී එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට විශාල හානි පමුනුවාලීමට කර්නල් දයා රත්නායක කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ලෙසින් 2000 මාර්තු මස 03 වන දින සිට 2000 සැප්තැම්බර් මස 07 වන දින දක්වා රාජකාරී ඉටු කර ඉන් අනතුරුව නැවතත් මධ්‍යස්ථාන සේනාවිධායක ලෙසින් 2001 සැප්තැම්බර් මස 24 වන දින සිට 2002 අගෝස්තු මස 27 වන දින දක්වා අවස්ථා දෙකකදී කර්නල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී විශිෂ්ට සේවයක් ඉටු කර ඇත.

2002 පෙබරවාරි මස 22 දින රජය හා එල්ටීටීඊ සංවිධානය සමඟ ඇති කරගත් අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක වූ අතර, එම කාල වකවානුවේදී එල්ටීටීඊ සංවිධානය තුළ ඇතුවූ නායකයින්ගේ හැල හැප්පීම් මත ඔවුනොවුන් අතර ගැටුම් ඇති විය. නැගෙනහිර පළාතේ එල්ටීටීඊ සංවිධානයේ අණසක පතුරවාගෙන සිටි කරුණා අම්මාන් නැමති කොටි නායකයා එම සංවිධානය අතහැර රජයට එක්වන අවස්ථාවේ ශ්‍රී ලංකා යුද හමුදාව වෙත විවිධ චෝදනා එල්ල කිරීමට එල්ටීටීඊ සංවිධානයට හා වෙනත් බලවේගයන්ට ඉඩ නොදී තම බළ ප්‍රදේශයේ හටපිරිස් වෙත නිවැරදි නායකත්වය හා උපදෙස් ලබාදීමට කර්නල් දයා රත්නායක කටයුතු සිදු කළේය.


තම දැනුම හා ලද අත් දැකීම් උපයෝගී කරගනිමින් රාජ්‍ය ආරක්‍ෂක අමාත්‍යාංශයේ යුද මාණ්ඩලික නිලධාරී ලෙස ද, 2003 වසරේ සිට 2004 වසර දක්වා රාජකාරී කර එතැනින් නොනැවතී 2004 ඔක්තෝබර් මස 04 වන දින යුද හමුදා මාධ්‍ය ප්‍රකාශක ලෙසින් බ්‍රිගේඩියර් දයා රත්නායක කටයුතු සිදු කරන ලදී. මෙම කාලය තුළදී රටේ පැවති අනාරක්‍ෂිතභාවය හමුවේ යුද හමුදාවේ විස්තර ඉදිරිපත් කිරීමේදී වරක් නොව කිහිපවරක් සිතා මතා සිදු කළ යුතු වුවත්, මාධ්‍යවේදීන් ඉදිරියේ නොපැළිකිව රටේ ආරක්‍ෂක තත්ත්වය පැහැදිලි කළේ එදා මලියදේව විදූ මාතාවගේ සෙවනේදී විවාද කණ්ඩායමේ නායකයා ලෙසින් ලද පන්නරය තුළිණි. තවද, මාධ්‍ය වේදීන්ගේ සමීප මිතුරෙක් මිස මාධ්‍යවේදීන්ගේ විවේචනයට ලක් වූ පුද්ගලයෙක් නොවූයේය. දිනපතා මාධ්‍ය සාකච්ඡා ඔස්සේ දෙස් විදෙස් හී හුරු පුරුදු දැවැන්ත ප්‍රතිරූපයක් බවට පත්වූයේ අපගේ කතානායකයන්ය.







## අංගම්පොර සටන් ශිල්පීන් සමඟින් ...



රෙජිමේන්තු අධිපති වශයෙන් කටයුතු කරමින් සිටියදී මානුෂිය මෙහෙයුමෙන් අත් අඩංගුවට පත් හා භාර වූ එල්ටීටීඊ සාමාජිකයින් 12000ක් පමණ සමාජගත කිරීම සඳහා පුනරුත්ථාපන අධ්‍යක්ෂක ලෙස රාජකාරී ඉටු කරන ලදී. තවද, එම කාර්යයද සාර්ථකව සිදු කරන අතරතුර ජ්‍යෙෂ්ඨතාවයට හා යුද බිමේ දක් වූ දක්ෂතාවයට ගෞරවයක් දෙමින් ශ්‍රී ලංකා යුද හමුදාවේ යුද හමුදා මාණ්ඩලික ප්‍රධාන තනතුරට පත් විය.

43 වන යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි ලෙස 2010 ජනවාරි මස 10 වන දින සිට යුද හමුදාවේම සුබ සාධනය ඇතුලු කාර්යයන් රැසක් ඉටු කිරීමට උසස් ලෙස දායකත්වය ලබා දී ඇත. දෙදහස් දහතුන වසරේ අගෝස්තු මස පළමු දින ලුතිතන් ජෙනරාල් නිලය දක්වා උසස්වීම් ලබා



## රණවිරු ස්මාරකයේ ඉදි කිරීම් පරීක්ෂා කරමින් ...

ශ්‍රී ලංකා යුද හමුදාවේ විසිවන යුද්ධ හමුදාධිපති ලෙස ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී පත්විය.

දෙවන ලුතිතන් වරයෙක් වශයෙන් ශ්‍රී ලංකා යුද හමුදාවට එක් වී විවිධ තනතුරු හොබවා යුද හමුදාවේ ඉහළම තනතුර දක්වා ආ ගමන් මඟ සේද මාවතක් නොවූනත් සේද මාවතේ පැමිනෙන්නන්ට වඩා සේවාවක් සෙබළ සොහොයුරන් වෙනුවෙන් ඉටු කර ඇත. ඒ පන්නරය මුලින්ම තම දෙමාපියන්ගෙන් ලබා ඉන්පසු මලියදේව විදුබිමෙන් ලබාගෙන ඇත. දුරු තනතුරු සහ හැදෑරු විදෙස් පාඨමාලාවන් ද, ඒ සඳහා ඉවහල් විය.



නව යුද්ධ හමුදාධිපතිතුමන් යුද හමුදාවේ වාර්තා කිහිපයක්ම තැබූ අයෙකි. ශ්‍රී ලංකා යුද හමුදාවේ දනට වැඩිම වීර පදක්කම් ලබා ඇත්තේ මෙතුමා පමණි. ඒ වීර වික්‍රම විභූෂනය එක් වරක්, රණ වික්‍රම පදක්කම සිව් වරක්, රණශූර පදක්කම සිව් වරක් වශයෙනි. එමෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විධායක ජනාධිපතිවරුන් ලෙස දනට පස් දෙනෙකු පත් වී ඇති අතර, එම විධායක ජනපතිවරුන් සියල්ල වෙතින් වීර පදක්කම් ලබාගෙන ඇත්තේද ලුතිතන් ජෙනරාල් දයා රත්නායක තුමන්ය.

නව යුද්ධ හමුදාධිපති තුමණි, ඔබ තුමන් අප සැමට ආදර්ශයකි. ඔබ තුමන් වෙත ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ අධිපති ඇතුලු සියලුම නිලයින්ගේ උණුසුම් සුබ පැතුම් මෙසේ එක්කරන්නෙමු.

## රෙජිමේන්තු සංවත්සර දිනකදී ..



# ක්‍රීඩකයකු වශයෙන් ක්‍රීඩාවට දැක් වූ ලැදියාව



ශ්‍රී ලංකා යුද හමුදා මලල ක්‍රීඩා ඉතිහාසයේ නව පිටුවක් පෙරළමින් 2004 වසරේ යුද හමුදා මලල ක්‍රීඩා කමිටුවේ සභාපති ධුරය බ්‍රිගේඩියර් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී (එවකට) වෙත භාර දුන් අතර, එම කාලය තුළ මලල ක්‍රීඩාව වෙනුවෙන් විශාල සේවයක් ඉටු කරන ලදී. පසුව රටේ පැවැති යුදමය වාතාවරණය හේතුවෙන් නැගෙනහිර ප්‍රදේශයේ ත්‍රස්තවාදය තුරන් කිරීමට පැවැරීම හේතුවෙන් යුද හමුදා මලල ක්‍රීඩා කමිටුවේ සභාපතිත්වය තාවකාලිකව සමු ගත්තා ලදී.

ත්‍රස්තවාදීන් තුරන් කිරීමේ කාර්යයන් නිමාවෙන් පසු නැවතත් යුද හමුදාව තුළ ක්‍රීඩාව නංවාලීම පිණිස 2010 වසරේදී යුද හමුදා මලල ක්‍රීඩා කමිටුවේ සභාපති ධුරය භාර ගන්නා ලදී.

මෙම දෙවන කාලය තුළදී තම රෙජිමේන්තුවේ හා සමස්ත යුද හමුදාව තුළම මලල ක්‍රීඩාවට මෙන්ම අනිකුත් ක්‍රීඩාවන්ගේ උන්නතිය වෙනුවෙන් විශාල කැපවීමක් කර රෙජිමේන්තුව තුළින් ද, දක්ෂ ක්‍රීඩකයින් බිහිකිරීමේ අරමුණින් කටයුතු කළේය. ඒ අනුව සියලුම ක්‍රීඩාවන් නංවාලීමේ අරමුණින් 2010 වසරේදී රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත එක් එක් ක්‍රීඩා සංචිතයන් හී සභාපතිත්වය පවරමින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයින් බිහිකිරීමට උපදෙස් ලබා දුනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් යුද හමුදාව ආරම්භයේදී අප රෙජිමේන්තුව විදහා දක්වූ ජයග්‍රහණයන් වෙත ළඟා වෙමින් මේ වන විට අනිකුත් රෙජිමේන්තු අභිබවා සුවිශාල ජයග්‍රහණයන් ලබා ගැනීමට හැකි වීම තුළින් විශාල කීර්තියක් ශ්‍රීලපාහ රෙජිමේන්තු වෙත ලබාගැනීමට සමත්ව ඇති බව අවිවාදයෙන් සඳහන් කළ හැක.

2011 වසර වන විට යුද හමුදා මලල ක්‍රීඩාව තුළින් දක්ෂ මලල ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර මට්ටමට රැගෙන



යැමට කළ මෙහෙවර අපමණය. ඔහුන් ලද පන්නරය අතිමහත්ය. ඒ හේතුවෙන්ම ජාත්‍යන්තර තරගාවලි පැවැති බ්‍රසිලය, සිංගප්පූරුව, ඉන්දියාව හා ස්පාඤ්ඤය යන රටවල්හි පැවති තරඟ සඳහා ඉදිරිපත්වීමට ක්‍රීඩකයින්ට හැකියාව ලැබුණි. ඒ අනුව අතිගරු ජනාධිපතිතුමා හා ක්‍රීඩා ඇමැතිතුමා ගේ උපදෙස් මත 2012 අප්‍රේල් මස 28 වන දින ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ සභාපති ධුරය සඳහා නාම යෝජනා ඉදිරිපත් කරන ලද අතර 2012 මැයි මස 03 වන දින පැවැති ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ නිලවරණයේදී නිතරඟයෙන් ගරු සභාපති ලෙස පත් විය. ශ්‍රී ලංකා ජාතික මලල ක්‍රීඩා සංගමයේ සභාපතිත්ත්වය ලැබීමෙන් පසු යුද හමුදාවේ පමණක් නොව සමස්ත ලංකාවේම මලල ක්‍රීඩා සංගමයේ මුල්ම අභියෝගය වූයේ 2013 වසරේ ජූනි මස 09 වන දින කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේ පැවැති 15 වන ආසියානු කනිෂ්ඨ මලල ක්‍රීඩා තරගාවලියයි. මෙම තරඟාවලිය සඳහා රටවල් 45ක ක්‍රීඩක ක්‍රීඩිකාවන් රාශියක් සහභාගි වූහ. ඉතා සාර්ථකව සංවිධානය කර විධිමත්ව පවත්වා මෙම තරඟාවලියෙන් මලල ක්‍රීඩා ජයග්‍රහණ රැසක් ලබාදීමට දායක වෙමින් යුද හමුදාවට පමණක් නොව සමස්ත ශ්‍රී ලංකාවටම කීර්තියක් අත්කර දෙන ලදී.




ක්‍රීඩා අංශය ශ්‍රීලපාහ

## ශ්‍රී ලංකාව නියෝජනය කරමින් බ්‍රසීලයේ සංචාරයේදී ...




# 23 සේනාංකාධිපති ලෙස රාජකාරී කළ කාල සීමාවේ ඇස ගිය තැන්





සතුරු ප්‍රදේශයක් නිරීක්ෂණය කරමින්





ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී 23 සේනාංකයේ සිදු කළ සංචාරය



යුද බිමේදී උපදෙස් ලබාදෙමින්





ආධාරක අවි පරීක්ෂාවක්



සිවිල් සමාජය සමඟින්




විදෙස් විද්වතුන් සමඟින්



රණවිරු දිනයකදී



විදෙස් හමුදා නිලධාරියෙකු සමඟින්--






සේනාංක මූලස්ථානයේ පැවති පිරිත් සජ්ඣායනාව

# ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ අතීත සභාපතිනිය

උදාර වූ අරමුණු රාශියක් මුදුන් පමුණුවා ගැනීමේ පරම පවිත්‍ර චේතනාවෙන් 1999 මාර්තු මස 03 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාව රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී පිහිටුවන ලදී.

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට අයත් මියගිය හා අතුරුදහන් අයවලුන්ගේ ළඟම ඥාතීන් වෙත සුබසාධන කටයුතු ඉටු කිරීම හා ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ආබාධිත තත්ත්වයට පත් නිලධාරීන් හා සෙබළුන්ගේ සුබසාධන කටයුතු ඉටු කිරීම සඳහා කටයුතු කිරීම මෙහි අරමුණ වේ. තවද සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා පාබල හමුදා සාමාජිකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුබසාධනය සිදු කිරීමත් කාලානුරූපීව ඔවුන්ගේ ජීවන ගමනට අත්වැලක් වීම යන සිතිවිලි සමුදායක් අපේක්ෂා කර ගැනීම මෙම ශාඛාවේ මූලිකම පරමාර්ථයයි.

ජාති ආගම් කුල භේද පසෙකලා සුබසාධක කටයුතු වලදී සීමා වැට මායිම් නැති මෙම ශාඛාවට ශ්‍රී ලංකාද්වීපයේ වෙසෙන මිනිස් සම්පතට යම් විපතක් සිදු වන්නේ ද හැකි අයුරින් උපකාර කිරීමට නොපැකිලෙන්නේය. අතීත මතකයක් ලෙස සුනාමි ව්‍යසනය හා අප රටේ ඇති වූ නියගයන්, ජල ගැලීම් සඳහා කළ කී දෑ අපමණය.





සුබසාදක කටයුතු ඉටු කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන සොයා ගැනීම සඳහා 2003.12.18 වන දින විදේශීය දානපතියන්ගේ ආධාර උපකාර මැද රෙජිමේන්තු මධ්‍යස්ථානයේ **"සිල්වර් බියුගලර්ස් ගැලන්ට් බේකරිය"** ලෙසින් ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබීය. අද වන විට එය ඉතා සාර්ථක ව්‍යාපාරයක් ලෙස වර්ධනය වී ඇත. ඊට අමතරව දේශීය විදේශීය දානපතියන්ගේ නොමසුරු උපකාර මධ්‍යයේ මෙම ශාඛාවේ අරමුණු මල්ඵල ගැන් විය.

නිහඬතාවයෙන් යුතුව අති මහත් සුබසාධන කටයුතු රාශියක් ඉටු කරමින් දීර්ඝ ගමනක් යන මෙම ශාඛාවට මඟ පෙන්වන්නේ මෙහි සභාපතිනියයි. එය කාලානුරූපීව වෙනස් වෙමින් පත්වීම් ලබයි.

ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාවේ තුන්වන සභාපතිනිය ලෙස දමයන්ති රත්නායක මැතිණිය 2009 ජූලි 05 වන දින සිට අවුරුදු හතරකටත් වැඩි කාලසීමාව තුළ විවිධ දුෂ්කරතා අපහසුකම් මධ්‍යයේ විශාල වැඩ කොටසක් ඉටු කරමින් සභාපති ධුරය දරන ලදී.

තමා සභාපතිනිය ලෙස කටයුතු කරන වකවානුව තුළදී මියගිය, අතුරුදහන් හා ආබාධිත මෙන්ම දැනට සේවයේ යෙදී සිටින රණවිරුවන් වෙත කරන ලද සුබසාධන කටයුතු අති මහත්ය. ඉන් බිඳක් සිහිපත් කරනවා නම්

නිවාස නොමැති රණවිරුවන් සඳහා රුපියල් කෝටියක්(1,000,000.00) පමණ වටිනා නව නිවාස 12 ක් සේවාවනිතා ශාඛාවේ ධන පරිත්‍යාගයෙන් රටේ විවිධ ප්‍රදේශ තුළ ඉදි කර ප්‍රදානය කර ඇත.

අඩක් නිමකල නිවාස වෙනුවෙන් ඉතිරි වැඩ නිමකර ගැනීම සඳහා රුපියල් 50,000.00 සිට 500,000.00 දක්වා නිවාස ආධාර මුදල් 100 දෙනෙකුට වැඩි පිරිසකට ලබාදී ඇත.

රණවිරුවන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් සඳහා ශිෂ්‍යාධාර මුදල් රුපියල් ලක්ෂ පහලොවකට ආසන්න ප්‍රමාණයක් ද මේ වන විට ලබා දී ඇත.

රණවිරුවන් හා ඔවුන්ගේ ළඟම ඥාතීන්ට විවිධ ශල්‍ය කර්ම වෙනුවෙන් වෛද්‍යාධාර සඳහා මුදල් රුපියල් ලක්ෂ දහයකට ආසන්න ප්‍රමාණයක් ලබා දී ඇත.

ඉහත සඳහන් ප්‍රධාන සුබසාධක කටයුතු වලට අමතරව පහත සඳහන් සුබසාධක කටයුතු පිළිබඳ කෙටි සටහනක් තබනුයේ නම්

සනීපාරක්ෂක කට්ටල
රෝද පුටු
අත්වාරු යුවල්
කෘතිම පාද

ආදී වශයෙන් විශාල ප්‍රමාණයක් රණවිරුවන් සහ ඔවුන්ගේ ඥාතීන් වෙත ලබා දී ඇත.







සැදැහැ සිතින් පිරි ගරු සභාපති තුමිය සෑම වර්ෂයකම යුද්ධ හමුදා රෝහල්, රණවිරු සෙවන හා අභිමංසල ආදී ස්ථාන වෙත ගොස් ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ දුවදුක් සොයා බලා ඔවුන්ට පැන නැගී ඇති පුද්ගලික ගැටළු සොයා බලා කඩිනම් විසඳුම් ලබා දී ඇත.



තවද, රණවිරුවන්ට පමනක් නොව අප රටේ පවතින ළමා නිවාස, වැඩිහිටි නිවාස හා මානසික රෝහල් වෙත ද ගොස් ඔවුන්ගේ ද දුක සැප බෙදා හදා ගැනිම මෙම ශාඛාවේ විශේෂත්වයයි.

සෑම දෙනාටම එක සාමාන වූ ශ්‍රී ලංකා පාබල හමුදා සේවාවනිතා ශාඛාව ලෝක ළමා දිනය, කාන්තා දිනය ආදී විශේෂ දිනයන් මුල් කර ගෙන වැඩ සටහන් සංවිධානය කරනු ලබයි.

ළමුන් වෙනුවෙන් ලෙෂර් වර්ල්ඩ් සංචාර වැනි වැඩසටහන් පැවැත් වීම හා කාන්තා දිනයන් තුළ දී ප්‍රවීන උපදේශකයින් ගෙන්වා රූපලාවන්‍ය වැඩ සටහන්, ඉහුම් පිහුම් වැඩ සටහන් ආදී වැඩමුළු පවත්වා කාන්තාවන්ගේ දැනුම වැඩි දියුණු කර ඉදිරි අභිවෘර්ධිය වෙනුවෙන් ස්වයං රැකියාවන්ට අත්වැලක් සපයන ලදී.



බුදු දහමට මුල් තැනක් දෙමින් කටයුතු කළ සභාපතිනියක් ලෙස සෑම වර්ෂයකම වෙසක්, පොසොන් පොහෝ දින වලදී බැතිමතුන් උදෙසා දන්සැල් ද, පවත් වන ලදී. තවද, දුෂ්කර ප්‍රදේශවල ජීවත් වන අධ්‍යාපනය ලබන දූදරුවන් සඳහා පාසල් උපකරණ ලබාදෙන ලදී.

වචනයේ පරිසමාප්තයෙන්ම ඔබ තුමිය කළ සේවය වෙනුවෙන් මෙසේ සටහන් තබමින් ඔබ තුමියගේ ඉදිරි ගමනට ආසිරි පතන්නෙමු.

**සේවාවනිතා ශාඛාව**
**ශ්‍රී ලංකා පාබල හමුදාව**



# "ඇන්ඩි"ට පෙම් බැඳි පාසැල් මිතුරෝ

කුරුණෑගල මලියදේවයේ 12 බී පන්තිය උසස් පෙළ ජීව විද්‍යා අංශයේ සිසුන්ගේ පන්තිය විය. ආර්එම්ඩී රත්නායක නම් වූ ශිෂ්‍යාගේ මලිදෙව් දිවියේ ඔහු ඉගෙන ගත් අවසාන පන්තිය එය විය.



ගමේ පාසලක අධ්‍යාපනය ලැබුවකුට මලියදේවයට ඇතුළත් වීම එදත් අභියෝගයක්ම විය. විශේෂ කුසලතාවයන් දක්වන්නෙකුට පමණක් එකී අවස්ථාව හිමිව තිබිණි.

ආර්එම්ඩී රත්නායක නම් වූ කුසලතාවයන් ගෙන් පිරුණු එම සිසුවා මලියදේවයට ඇතුලු වීමෙන් සිය කුසලතා විදහා දැක්වීමේ අවස්ථාව තියුණු කර ගත්තේය.

මලියදේවයට ඇතුලු වූ දා පටන්ම ඔහු අධ්‍යාපන කටයුතු සේම බාහිර කටයුතු වලට ද එකසේම දක්ෂයෙකු විය.

ගමේ වෙල් ඉපනැල්ලේ පොල් පිති බැට් එකෙන් බෝලයට තැලූ දයා රත්නායක මලියදේවයේදී ක්‍රිකට් ක්‍රීඩකයෙකු ලෙසට අත් දැකීම් එකතු කර ගත්තේය.

ඒ දිනවල ශ්‍රී ලංකාවට පැමිණ සිටි "ඇන්ඩි රොබට්ස්" නම් බටහිර ඉන්දිය කොදෙව් ක්‍රිකට් ක්‍රීඩකයා හා අනුරූප වීමක් ඔහු තුළ තිබූ නිසාවෙන්ම ඔහු අප අතර "ඇන්ඩි රොබට්ස්" නම් වූ සුරතල් නාමය හිමි කර ගත් අතර, පසු කලකදී ඔහුගේ සැබෑ නම ඇන්ඩි රත්නායක බවට සිතූ බොහෝ සිසුන් පමණක් නොව ගුරුවරුන්ද විය.

විද්‍යාලයේ එවකට සිටි කැපී පෙනෙන ශිෂ්‍යන් අතර දයා රත්නායක ද වූයේය. මගේ මතකයට එන සුවිශේෂී අවස්ථාවක් මෙහි සදහන් කරනු කැමැත්තෙමි.

70 දශකයේ අග භාගයේදී විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකු ඝාතනය වීම සම්බන්ධයෙන් රට තුළ විශාල සිසු උද්ඝෝෂණයක් ඇති විය. මලියදේවයද මේ උද්ඝෝෂණ ආක්‍රමණයට හසු විණි. එදින විද්‍යාලයේ සිසුන්ගේ උද්ඝෝෂණයට නායකත්වය ලබාදුන්නේ දයා රත්නායකය. මීට වසර තිහකටත් පෙර නායකත්වයේ ලක්ෂණ පෙන්නුම් කළේ ඒ අයුරින්ය. සැබවින්ම දඟකාර භද්‍ර යෞවනයේ සිටින විප්ලවකාරී පිරිසකට නායකත්වය දෙමින් ඔහු කළ උද්ඝෝෂණ පෙළපාළියේ වඩාත්ම ගැඹුර වූයේ කිසිම ශිෂ්‍යයෙකුට විදුහලින් පිටත ඒමට නොදී ඉතාමත් විනයානුකූලව එකී ජන සමූහය පාලනය කර ගැනීම වේ. මගේ මතකය නිවැරදි නම් එවකට ඔහු අවම තරමේ විද්‍යාලයේ ශිෂ්‍ය නායකයකු ලෙස හෝ පදවි ලබා තිබුණේවත් නැත.

ක්‍රිකට් ක්‍රීඩාවට මෙන්ම ඔහු දක්ෂ මලල ක්‍රීඩකයෙකු ද විය. නිවාසාන්තර මලල ක්‍රීඩා තරගාවලියේදී ඔහුගේ දස්කම් මනාව කැපී පෙනුණු අතර මා ගැමුණු නිවාසයේ නායකත්වය දරණ කළ ඔහු තිස්ස නිවාසයේ නායකත්වය දැරීය.

එක දිගටම පෙන්වනු ලැබූ දස්කම් නිසාවෙන් විද්‍යාලයීය ශිෂ්‍ය නායක පදවියකටද පත් වූ ඔහු පසු කලෙකදී විද්‍යාලයීය ශිෂ්‍ය නායක මඩුල්ලේ උප ප්‍රධාන ශිෂ්‍ය නායකයා ධූරයටද පත් විය.

සමකාලීන මිතුරකු වශයෙන් නව යුද්ධ හමුදාධිපති වරයා පිළිබඳව ලියන ලිපියේ ඔහුගේ ඇති සුවිශේෂී ගුණයක් සදහන් කළ යුතුම වන්නේය.

මගේ ජීවිතයේ මුණ ගැසුණු බොහෝ මිනිසුන් අතරේදී හේ ඉතාමත්ම නිහතමානී පුද්ගලයෙකි. කල්‍යාණ මිත්‍රයෙකි. එපමණක් නොව කලාකාමී හදවතක් ඇති හොඳ රසවතෙක් ද විය. "විෂ්ණු ශර්මන්ගේ පංචතන්ත්‍ර කෘතියේ" සඳහන් කෑමෙන් ද, කැවීමෙන් ද, දීමෙන් ද, ගැනීමෙන් ද, රහස් කීමෙන් ද, රහස් රැකීමෙන් ද, කල්‍යාණ මිත්‍රයාගේ සමාගමෙන් ලැබිය හැකි සෑම ආශ්වාදයක්ම ඔහු කෙරෙන් අප අත් වින්දෙමු.

ශ්‍රී ලංකා යුද හමුදාවේ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජනරාල් දයා රත්නායක මැතිතුමා සොඳුරු ආඥාපතියෙකු යැයි මට සිතේ.

ඔහුට "සුබ සහ යස" පතමි.

**සරත් රත්නායක**
**(ඉගෙනුම ලැබූ පන්තියේ මිතුරෙක්)**

# වීර වික්‍රම විභූෂණයෙන් පිදුම් ලැබූ ඳු...



උත්තම මිනිස් ගති හද තුළ ඇත මතුවී
රත්නායක මැතිඳ අද හමුදා පතිවී
තුන් සිංහලය සුරැකීමට ඇප කැපවී
ඇතිවී තිබෙන නිදහස රැකගනු මැනවී

සිව්බඹ විහරණෙන් පිරිපුන් ගුණ රැඳුන
ආගම දහම පිළිබඳ නීති ගරු කරන
යුද බිම කෙලිපිටිය දෙක වෙනසක් නොදන
ඔබ පියමගෙහි සෙබළුන් හැම පෙළ සැදින

හෙළ දූ පුතුන් රට දැය සුරකිනු පිණිස
යුග යුග වලදී යුද වැදී යුරු පෙර දවස
එම රජ දවස රුපුසෙන් බිඳ ලස පහස
තවමත් කියා දෙයි ඉතිහාසයෙ රහස

කරදර කොතෙක් ආවත් වත සිනහ රැඳී
විනයට අවංකව කටයුතු කරන ලදී
සෙබළුන් සමඟ යුද පෙරමුනෙ එකට වැදී
තල් මණ්ඩියේ කොටි බංකර බිඳින ලදී

මගේ මව්බිමට මෙහෙවර ඉටු කරන් නට
දිවි නොතකමින් රුපුසෙන් හා සටන් කොට
ගරු සම්මාන නිසි සමයේ ලබන විට
ඇතිවන සතුට වදනින් කිව නොහැක මට

වන්නි මානුෂික මෙහෙයුම කළ දවසේ
පෙන්වූ විරු විකුම් අගය ඇත නිසියේ
ගෙන්නා ගෙන මිහිඳු ජනපති නිල- නිවසේ
පැළඳු පදක්කම් ඔබේ වත මත දිලිසේ

මා සෙබළෙක්ව ඔබ යටතේ වැඩ කෙරුම
තිබුනත් ආශාව අද එය නැත දුරුම
දන් දුණි වකුගඩුව ඉන් ලද පින් මහිම
මැතිඳුනි ඔබට අත් වෙයි දිවි ඇති තුරුම

සුරතට සතුරු බල වනසන අවිය අරන්
විරත්වයේ දැ අභිමන් පහළ කරන්
අද පිය නගන හමුදාපති පදවි දරන්
මැතිඳුණි ඔබට පිහිටයි දෙවි සතර වරන්

සෙ/10267 කෝප්‍රල් ගාමිණී ගුණපාල එච් ( විශ්‍රාමික) සැනසුම, කිරිමැටි වත්ත, ගොඩගම, හෝමාගම.

# ශ්‍රීලපාහ ඒකක සංචාර




1 ශ්‍රීලපාහ ඒකකයේ 63 වන බළඇණි සංවත්සරය 2013 මැයි මස 12 වන දින පනාගොඩ කඳවුරේදී පවත්වන ලදී. එම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙසින් සහභාගී වූ මේජර් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විශේෂ අවස්ථාවන් රූ කාවයේ සනිටුහන් වූ අයුරු




රෙජිමේන්තු අධිපති තනතුර භාර ගැනීමෙන් පසු 2010.01.11 දින සහ 2012.08.02 දින 2(සේවා) ශ්‍රීලපාහ ඒකකය ස්ථානගතව සිටි කොස්ගම සාලාව සහ කැළණිමුල්ල යුද හමුදා කඳවුරු වෙත ඒකක හටපිරිස් ඇමතීම සඳහා පැමිණීම.




නව යුද හමුදාපති තුමන් වැඩ භාර ගැනීමට ප්‍රථම 2013.07.14 දින 4 ශ්‍රීලපාහ ඒකකයේ නව බළඇණි මූලස්ථාන ගොඩනැගිල්ල විවෘත කිරීම




නව යුද හමුදාපතිතුමා 2010.01.07 දින රෙජිමේන්තු අධිපති ලෙස 5 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ සිදු කළ කඳවුරු සංචාරය




2012.01.18 දින කිලිනොච්චියේ පිහිටි 7 ශ්‍රීලපාහ නිවාඩු නිකේතනයේ සිදු කරන ලද සංචාරය



8 ශ්‍රීලපාහ ඒකකයේ අවස්ථාවන් දෙකකදී වත්මන් යුද්ධ හමුදාධිපතිතුමා රෙජිමේන්තු අධිපති ලෙස රාජකාරී කළ අවදියේ සිදු කළ සංචාරයන්




11 ශ්‍රීලපාහ ඒකකයේ මූලස්ථානය ස්ථාපනය කිරීම සඳහා මුල්ගල 2012.01.21 වන සිදු කර 2012.12.03 වන ශ්‍රී ලංකා යුද හමුදා මාණ්ඩලික ප්‍රධානී හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති විසින් විවෘත කරන ලදී.




12 ශ්‍රීලපාහ ඒකකයේ බියුගල්ස් නිවාඩු නිකේතනය රෙජිමේන්තු අධිපති ලෙසින් රාජකාරි කළ කාල සීමාවේදී විවෘත කළ අවස්ථාව.





15 ශ්‍රීලපාහ ඒකකයේ සංචාරය කළ අවස්ථාවන්






19 ශ්‍රීලපාහ ඒකකය වඩාකාඩු මල්ලාවි ප්‍රදේශයේදී පැවැත්වූ අන්තර් ඒකක වෙඩි තැබීමේ තරගාවලියක් 2009.09.16 දින පැවැත්වූ අතර, එවකට රෙජිමේන්තු අධිපතිව සිටි වත්මන් යුද හමුදාපති ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ඒකකයට පැමිණි අවස්ථාව






ශ්‍රීලපාහ රෙජිමේන්තු පුහුණු පාසැල බූස්ස කඳවුරේ රෙජිමේන්තු අධිපති ලෙසින් රාජකාරි කළ කාල සීමාවේදී සිදු කළ සංචාරයන්.



# උදාරයි ඔබ



කුරුණෑගල මලියදේව විදුහල සිප් සත දුන්නු
අවුරුදු විසි දෙකනි වයස හමුදාවට මග පෙන්නු
තරුණ වයස හැර තරමින් ජවයෙන් හැම දිරි ගැන්නු
කරුණාවත් හැකියාවත් ඔහුගේ හැකියට උන්නු

බිබිළුත ගුණිගසක් බිරිගිය පාබල හමුදා විරුවෙකි
දුබල නොමැති ඔහු නිසිවට වඩාතර පිවතගේ දුරුවෙකි
ප්‍රබල අදිටනින් පිං පිබිදෙමින් ඔහු ගුණ දැමී හරුවෙකි
සකල සත්ති හැම හදවත් පුබුදු කොටේ නම් බොරුවෙකි

විතුමින්ගේ ජය මාවත කටු කොහොලින් පිරි තිබෙයි
සතුටු වන්න නැත මෙහෙකළ ලද කොරතුරු රැසකි ගෙයි
සතුරට විලුම් ඉදුරෙයදී මුහුණ දුන්නු අභය හිමයි
මිතු පරපුර වෙත දැක්වමු සැමගෙම ආචාර ලැබෙයි

විර විකුම් විශුෂණ ගම් පදක්කමෙන් පිදුම් ලද ඔබ
සූර ලෙස හිස් වසක් සතුරට මුහුණ දුන් විඩාතර පුතුණි ඔබ
ඝෘහරා කොටිමෙට පසුබිසින අදුරු පෙරදුන් භාගෙතන්වම ඔබ
ඔහරණ් වී මෙලක විසිවක යුද්ධ හමුදාපති තුමින් ඔබ

ඔබ තුමින් කළ සේවාව අගයන්න පිදි වෙ පොතක් ලිවත්
හබ කොටන්නට වග බලාගෙන පිලල ක්‍රීඩා දියුණු වුවත්
තුමි දුන්නු "හල් ගෙවන" වාගේම "උදාරයි ඔබ" සවුරු කිවත්
ලැබ තිබෙම් මුලු ලොවේ දිදුලන නාමයක් මේ ලෙසින් පැවත්

ලොවිතුරා සම්බුදු රදුන්ගේ උතුම් ගුණයන් ඔබ සතුව ඇත
මව් රටට දිවි පිදූ විරු හට කොලුම් ගුණ දැන් විම කොම සිත
ඔව් සිරට පව් නොමැත පිණිස කොමිම් ලක්මිව දෙසට සිත සත
සිව වරන් දෙවියන් හැටෙවා ඔබට හමුදාපති තුමිනි සෙත

සෙ/329809 සායෙ උදාන කුමාර පිටිල්ආර්
තුවක අංශය ශ්‍රීලංකා

2013 අගෝස්තු මස 09 වන දින
රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ ඉදිරිපිටදී
සමූහ ඡායාරූපයකට පෙනී සිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති
ලුතිතන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී

